WWW.ALEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

(පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus)

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

සිංහල I
சிங்களம் I
Sinhala I

71 S I

2019.08.10 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස්:**

※ **පළමුවැනි** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

※ පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.

● පහත දැක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. (අ) සිටාණෝ මුසුප්පුව පියා සිටුදුවණියන්ට කියන්නෝ 'සොඳුර, කුඩා වත් කිම, මහත් වත් කිම? තිලින් එක් කබලුකැවුමක් දීපියව'යි කිවුය. සිටුදුවණියනුත් එකක් හැරගෙන පිළිගන්වන්ට යයි එකක් අල්වාලන්නා ම මහතෙරුන්වහන්සේගේ ආනුභාවයෙන් හැම කබලුකැවුම් ම එකබඳ ව ඇලිණ. සිටුදුවණියෝ එකක් වෙන් කරන්ට උත්සාහ කොටලා 'මේ කබලුකැවුම් පිසීමෙන් වෙන් බව මුත් තිබීමෙන් එක් විය. වෙන් කොටගත නොහැකි ය'යි කිවුය. එසේ වී නම් ඉඳොයි කියාලා තුමූත් එකක් වෙන් කරන්ට යත්න කොට වෙන්කොටගත නුහුණුවුය. පිසු තැනැත්තවුන් හා පිසවූ තැනැත්තවුන් හා දෙන්න එක් ව එකක් වෙන් කොට ගන්ට යත්න කොටත් වෙන්කොටගත නුහුණුවුය. ගත් ආයාසයෙන් ඇඟින් ඩහ් වැගිරෙන්ට වන. කබලු කෑමට රිසිත් ගියේ ය. ඉතිකින් දෙන්නත් සිතාගෙන 'අපට කබලුකැවුම් නොකැමැත්තේ ය. පැසින් ම දීපියව'යි කියා සිටුදුවණියන්ට කිවු ය.

(i) කබලු කැවුම් පිළිගැනීමට පැමිණියේ කවරකු ද?

(ii) එක් කබලු කැවුමක් ගැනීමට තැත් කළ විට සිදු වූයේ කුමක් ද?

(iii) කබලු කැවුම් වෙන් කිරීමට උත්සාහ කරන ලද්දේ කවුරුන් විසින් ද?

(iv) **මුසුප්පුව** හා **පැසින්** යන වචනවල අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

(ආ) බෝධිසත්වයෝ ඒ චන්ද්‍ර කුමාරයනුත් කල් යවා නොයන හෙයින් "එක්තරා අන්තරායෙක් විය යුතු ය"යි තුමූ එතනට ගොස් දෙදෙනා ම විලට බට පියවර සටහන් දැක "මේ විල රාක්ෂසයකු අධිගෘහිත විලක් වුව මැනවැ"යි සිතා කඩුව උරයේ එල්වා ගෙන දුන්න නගා දුනු මිට හිය ලා ගෙන සිටියාහුය. දිය රකුසු බෝධිසත්වයන් දියට නොබස්නා දැක වල දඬු කපා ඇවිදිනා පුරුෂයකු මෙන් තමාගේ ස්වරූපය පාලා බෝධිසත්වයන්ට කියන්නේ "පින්වත් වූ පුරුෂය, තොපි මග ගමන් යාමෙන් මිරිකී ගියව, කුමක් හෙයින් මේ විලට බැස නා පියා පැන් බී නෙළුම්බල හා නෙළුම්දැලි කා මල් පැළඳ සැපසේ නො යවු දැ"යි කිවු ය.

(i) විලට රාක්ෂසයකු අධිගෘහිත බැව් බෝධිසත්වයන් දැන ගත්තේ කෙසේ ද?

(ii) බෝධිසත්වයන් සූදානම් ව සිටියේ කෙසේ ද?

(iii) දිය රකුසා ගත් වේශය කුමක් ද?

(iv) **නෙළුම්බල** හා **නෙළුම්දැලි** යන වචනවල අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

[දෙවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ඉ) ඉක්බිති දුටුගැමුණු රජ්ජුරුවෝ ශාලිරාජ කුමාරයන්ට යුවරජ තනතුර දී අනුරාධපුර නුවර දකුණු වීථියෙහි මහත් වූ ප්‍රාසාදයක් කරවා දුන්හ. රාජකුමාරයන් ඒ ප්‍රාසාදයෙහි වසන කල්හි දකුණු දිග ගම්වල පටන් ඒ දිශා භාගයෙහි සියලු දනවු වැසි මනුෂ්‍යයෝ ඒ දිගින් නුවරට නිමන අනෙකප්‍රකාර වූ සියලු ම අයමුඩය රාජකුමාරයන්ට ම ගෙනවුත් දෙති. එකල දවසෙක රාජකුමාරයෝ අටසිල් සමාදන් ව ඉසුරුමුණි විහාරයට ගොස් පෞෂධාංගශීලය ආවර්ජනා කෙරෙමින් උන්හ. ඒ දවස් දකුණු දිශාභාගයෙහි මනුෂ්‍යයෝ සියක් ගැල් පුරා බොහෝ පඬුරු ගෙන්වාගෙන අනුරාධපුරයට යන්නාහු ඉසුරුමුණි විහාරය සමීපයට පැමිණියහ. එකල ගැල් අදනා ගොන් වියකරින් හෙළා ගැල් නො ඇද සිටියහ. මනුෂ්‍යයෝ නොයෙක් උත්සාහ කොට ගැල් පැද යා නො හී සිටියහ.

(i) ශාලිරාජ කුමාරයාගේ ප්‍රාසාදය පිහිටියේ කොහි ද?

(ii) ඉසුරුමුණි විහාරයේ දී ශාලිරාජ කුමාරයන් යෙදී සිටි කාර්යය කුමක් ද?

(iii) එකල ගැල් අදනා ගොනුන් කළේ කුමක් ද?

(iv) **නිමන** හා **ආවර්ජනා** යන වචනවල අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

(ඊ) කෙළන ළඳුන් සොමි වුවනින් දිනනුවට
මෙන තුරු සෙන් ගෙන එන පුන් තරිඳු හට
නුබ වෙසෙසින් අවසර කර යන ලෙසට
බල යසසින් යනු රිවි බිඹු පැළ'ඹරට

නිබඳ දිළෙන දිනමිණි මැද මිණිනි බඳ
නොමඳ වොරැඳි සඳ වෙල අබරණ පැළඳ
පැහැද සොබන පැළ දිග'ගන දුට සබඳ
එ සඳ සිතෙයි තුඩු රසිනුදුළ තගෙ ළඳ

(i) තාරකා නමැති සේනාව සමග සඳ පැමිණියේ ඇයි?

(ii) බටහිර දිශාව නමැති කාන්තාවගේ ස්වරූපය කවියා ඉදිරිපත් කරන්නේ කෙසේ ද?

(iii) 'දිනමිණි මැද මිණිනි' යන්නෙහි ඇති කාව්‍යාලංකාරය නම් කරන්න.

(iv) '**තුඩු රසිනුදුළ තගෙ ළඳ**' යන්නෙහි අර්ථය පහදා දෙන්න.

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "සැවත් නුවර අසවල් වීථියේ මෙනම් සිටුකුලයෙක් ඇත. හඳුනන්නේ ඇද්දැ'යි"

(ii) "සබඳ වැදි පුත්‍රය, සියලු ම මාර්ගෝපකරණ සපයා නිමවන ලද. එබැවින් මේ සියලු උපකරණ පසුඹිය හැර ගනෑ"

(iii) "එම්බල කොල මෙතෙක් කල් මා තෙරුන්වහන්සේට දුන් පිළි ගෙන ගියේ තෙපි ම දැ'යි"

(iv) "නුමුත් මම නම් තාම එයාට විතරයි ආදරේ. වෙන කිසි ම කෙනෙකුට ඒ වගේ ආදරේ නෑ."

(v) "ඇහුණා විතරක් නෙමෙයි. මට ඒකෙ තේරුමත් වැටහුණා."

(vi) "අර ඉන්නේ. අර ලී කොටයක් වගේ පාවෙන්නේ කිඹුලා තමයි" (ලකුණු 08 යි.)



උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ඍ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

රන් හැට්ටය හැඳ
රන් පටියෙහි
දිග කඩුව බැඳ,
අසු පිට නැගුණු කුමාරයා
ගම් නියම් ගම් රාජධානි
පසු කොට ගියේ ය.
පස් වසක් ගමන් කළ ඔහු
විවාහ කොටගත් කුමරිය
ගෙන එන්ට
තව පස් වසක් ගත විය.
"එවැනි රුවක් නො දිටිමු"යි
ඈ ගෙනා දින
පුර වැස්සෝ කීහ.
එදින සවස් කල
පුර දොර අසලදී,
රජ ගෙදර
දොරටුපල්ලාගේ දුව
භද්‍රා
කුමරුට හමු විය.
"තී කවුරු ද?"යි
ඔහු විස්මයෙන් ඇසීය.
"තිගේ වැනි රුවක්
මම කිසි කලක නො දිටිමි." (ලකුණු 16 යි.)

2. "සද්ධර්මරත්නාවලිය වූ කලී කථා කීමේ කාර්යය ධර්ම දේශනා කිරීමේ කාර්යයෙන් වෙන් නො කළ කෘතියකි." නියමිත කථා වස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න.

**නැතහොත්**

උගත් නූගත් පාඨක දෙපිරිසේ ම කල්පනා ශක්තිය තියුණු කිරීමටත් දැනුම දියුණු කිරීමටත් ජාතක පොතෙන් ලැබෙන දායකත්වය නියමිත කථා වස්තු **දෙකක්** ඇසුරෙන් පිරික්සන්න. (ලකුණු 15 යි.)

3. "රසය නො පිරිහෙළා කථා ඉදිරිපත් කරන ආකාරයෙන් සද්ධර්මාලංකාරය ශ්‍රාවක - පාඨක දෙපිරිසේ ම සිත් දිනා ගනී." නියමිත කථා වස්තු ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

4. "ගිරා සන්දේශ කතුවරයා ස්වභාව සෞන්දර්යයට බෙහෙවින් ඇලුම් කළ කවියෙකි." වර්ණනා **දෙකක් වත්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

5. පුද්ගලයා මුහුණ දෙන ආධ්‍යාත්මික කම්පනයන් කාව්‍යාත්මක ලෙස ප්‍රතිනිර්මාණයෙහි ලා කතුවරයා සමත් වී ඇති ආකාරය මළගිය ඇත්තෝ නවකතාව ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

6. තම දරුවන්ගේ අනාගතය පිළිබඳ අපේක්ෂා සහගත වූ දෙමාපියන්ගේ මානසික ස්වභාවය නූතන සිංහල කෙටිකතා රචකයාට විෂය වූ ආකාරය නියමිත කෙටි කතා **තුනක් වත්** ආශ්‍රය කොට ගෙන සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

7. "ජීවිතයේ විවිධ සංක්‍රාන්ති අවස්ථා පිළිබඳ සියුම් නිරීක්ෂණ ශක්තිය ප්‍රකට වීම නූතන සිංහල කවියෙහි කැපී පෙනෙන ලක්ෂණයකි." නියමිත පද්‍ය පන්ති **තුනක් වත්** නිදසුන් කොට දක්වමින් පහදන්න. (ලකුණු 15 යි.)

8. රත්නාවලී නාට්‍යයෙහි ඇතුළත් සාගරිකාගේ චරිතය, නාට්‍ය විකාශනයෙහි ලා උපකාරී වන ආකාරය නිදසුන් ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

* * *

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

WWW.ALEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

## II කොටස

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලෝකයේ බොහෝ රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද වැඩිහිටි ජනගහන ප්‍රතිශතය ඉහළ යාමේ සමාජ අර්බුදයට මුහුණ දෙමින් සිටී. මෙම වැඩිහිටියන්ට රැකවරණය සැලසීම සම්බන්ධයෙන් වර්තමානයේ ප්‍රබල සමාජ මතයක් ගොඩනැගෙමින් පවතී. බටහිර රටවලටත් ඇතැම් පෙරදිග රටවලටත් වඩා ශ්‍රී ලාංකේය පවුල හා ප්‍රජාව තුළ වැඩිහිටියන් රැකබලා ගැනීමට අදාළ ව ක්‍රියාත්මක වූ ප්‍රජාපාදක ආරක්ෂිත ජාලයක් පැවති බව සාම්ප්‍රදායික සමාජ රටාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. වර්තමානයේ පවා බොහෝ වැඩිහිටියන් තම දරුමුණුබුරන් හෝ ඥාතීන් සමග ජීවත් වීමට වැඩි කැමැත්තක් දක්වන බව සමාජ පර්යේෂකයෝ පවසති. සාඵල්‍යතාව අඩුවීම නිසා දරුවන්ගේ ප්‍රමාණය පහළ යාම, දේශීය හා විදේශීය සංක්‍රමණ, නාගරීකරණය හා කාන්තාවන් රැකියාවල නිරත වීම ආදි සාධකවල ඍජු බලපෑම නිසා පවුල කේන්ද්‍රීය ව ක්‍රියාත්මක වූ වැඩිහිටියන් රැකබලා ගැනීමේ ක්‍රියාවලිය වර්තමානයේ අභියෝගයකට ලක් වෙමින් පවතී. බොහෝ පර්යේෂකයන් පෙන්වා දෙන පරිදි ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි සිදුවන ප්‍රජාවිද්‍යාත්මක හා සමාජ, ආර්ථික වෙනස්කම් හේතුවෙන් හටගැනෙන පවුල් විසංවිධානය නිසා වියපත් වූවන්ගේ රැකවරණය සඳහා පවුල තුළ සක්‍රිය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වීමට බාධා මතු වේ. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා තදනුබද්ධ ධනාත්මක ලක්ෂණ, යටිතල පහසුකම් හා අවශේෂ සේවාවන් ප්‍රවර්ධනය කිරීමටත් කළමනාකරණ ක්‍රියාවලිය වඩාත් විධිමත් කිරීමටත් කාර්ය මණ්ඩලයට නිසි පුහුණුවක් ලබා දීමටත් අවශ්‍ය කටයුතු සම්පාදනය වුවහොත්, මෙරට සංස්කෘතියට හා සමාජ ව්‍යූහයට ගැළපෙන ආකෘතියක් ගොඩනගා ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත. වියපත් වූවන් හැකිතාක් දුරට රටේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ කොටස්කරුවන් බවට පත් කර ගැනීමට ප්‍රතිපත්ති සැකසීම ඔවුන්ගේ කායික හා මානසික සෞඛ්‍යය යහපත් වීමටත් රටේ සංවර්ධන ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් වීමටත් බලපානු ඇත.

(i) සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජයේ වැඩිහිටියන් රැකබලා ගැනීම උදෙසා ක්‍රියාත්මක වූ වැඩපිළිවෙළ ලේඛකයා හඳුන්වන්නේ කවර නමකින් ද?

(ii) වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා අතීතයේ පැවති ක්‍රියාවලිය වර්තමානයේ අභියෝගයකට ලක් ව ඇත්තේ කවර කරුණු හේතුවෙන් ද?

(iii) වියපත් වූවන්ගේ කායික හා මානසික සෞඛ්‍යය යහපත් කිරීම උදෙසා ලේඛකයා යෝජනා කරන්නේ කුමක් ද?

(iv) මෙම පාඨයෙහි සඳහන් වන ආකාරයට මෙරට සංස්කෘතියට හා සමාජ ව්‍යූහයට ගැළපෙන ආකෘතියක් ගොඩනගා ගැනීමට සම්පාදනය විය යුතු අවශ්‍යතා මොනවා ද?

(v) වියපත් වූවන්ගේ රැකවරණය සඳහා පවුල තුළ සක්‍රිය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වීමට බාධාව වශයෙන් සමාජ පර්යේෂකයන් දක්වන්නේ කුමක් ද?

(ලකුණු 10 යි.)

[පස්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සහභාගිත්ව සංවර්ධනය බිහිවන්නේ දුප්පත් ජනතාවගේ ස්වශක්තිය, සහභාගිත්වය එක්වී බිහි වන නිර්මාණශීලී නව උත්පාදන ශක්තිය තුළිනි. එහෙයින් ම මෙම සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලිය අතිශයින් ම ගැඹුරු වනු පෙනේ. එමෙන් ම අර්ථවත් වනු දිසේ. අනෙක් අතට ජනතා පදනමක් ද එහිලා පැනේ. එමතු ද නොව පවත්නා සාම්ප්‍රදායික සංවර්ධනය වෙනුවට බිහිවන විකල්ප සංවර්ධන ක්‍රියාවලියක් ද වනු ඇත. සහභාගිත්ව සංවර්ධනය බාහිර මූල්‍යාධාර, මහජන ප්‍රයෝජනයට අදාළ විවිධ සහනාධාර හෝ වෙනත් ද්‍රව්‍යමය ආධාර ආදිය අපේක්ෂාවෙන් ආරම්භ කරනු ලබන සංවර්ධන ක්‍රියාදාමයක් නම් නො වේ. සාම්ප්‍රදායික සංවර්ධනයේ දී දිළිඳු ජනතාවගේ නිර්මාණ ශක්තිය මතු වීමට පෙරාතුව ම බාහිර ආධාර ඉස්මතු වෙයි. ඒ සමග ම නැගී එන අංකුර නවෝත්පාදන දහරා වියැකී යයි. නමුත් සහභාගිත්ව සංවර්ධනයේ දී බාහිර ආධාරයන් මත නොව ජනතාවගේ ස්වශක්තිය හා සහභාගිත්වය එක්වීමෙන් බිහිවන නිර්මාණ ශක්තිය සංවර්ධනයේ ඒකායන බලවේගය බවට පත් වෙයි. බාහිර ආධාර සහ සහනාධාර මත පදනම් වූ වැඩසටහන් එම ආධාර ලැබීම් නැවැතීමත් සමග ම ඇණ හිටී. නැතහොත් අතුරුදහන් වනු ඇත. නමුත් සහභාගිත්ව සංවර්ධනයේ දී එසේ නොවන්නේ ජනතාවගේ නිර්මාණාත්මක නවෝත්පාදන ශක්තිය ඒ වන විට වර්ධනය වී සියත් බව තුළ සහභාගිත්වයේ ම රැඳෙන බැවිනි. මේ නිසා සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලියේ දී රජයෙන් ලැබෙන ආධාර, වෙනත් සහනාධාර, බැංකු ණය ප්‍රතික්ෂේප කරන්නේ ය යන පටු හැඟීමක් ඇති වීමට ඉඩ තිබේ. එහෙත් එය එසේ නො වේ. එය සමස්තයක් වශයෙන් ම වැරදි සහිත වෙයි.

(ලකුණු 15 යි.)

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) දේශපාලන අරගල, මැතිවරණ සහ ශ්‍රී ලංකාවේ අනාගත අභියෝග

(ii) ගෝලීය ත්‍රස්තවාදය මැඩපැවැත්වීමට ලෝක බලවතුන් මැදිහත් වීමේ අවශ්‍යතාව

(iii) භාෂාව, සාහිත්‍යය මෙන් ම ඉතිහාසය ද හැදෑරීමට පාසල් ශිෂ්‍යයන් යොමු කරවීමේ කාලෝචිත බව

(iv) ජයග්‍රහණය ම නො ව කායික - මානසික සෞඛ්‍ය වර්ධනය ද ක්‍රීඩාවේ පරමාර්ථවලින් එකකි.

(v) මෙරට පාසල් ශිෂ්‍යයන්ගේ නව නිපැයුම් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට යොදා ගැනීමේ යෝග්‍යතාව

(vi) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාව නගරවලට සංක්‍රමණය වීමෙන් ඇති විය හැකි සමාජීය හා සංස්කෘතික අර්බුද

(ලකුණු 25 යි.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) මේ කර්මාන්ත ශාලාවෙහි ඉතා දක්ෂ සේවකයන් ඇත.

(ii) අනාථ නිවාස පාලිකාව ඔහු දරුවෙක් මෙන් ඇති දැඩි කළා ය.

(iii) අපි වෙනුවෙන් වැඩ කිරීම සඳහා අපි ම පෙළ ගැසෙමු.

(iv) 'වීරාභිවන්දන' උළෙලේ දී ඇමතිතුමා විසින් ජාතික වීරයෝ ඇගයෙති.

(v) තනතුරු ලෝභයෙන් කටයුතු කරන්නෝ ආත්මාර්ථකාමීන් වෙති. (ලකුණු 05 යි.)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) ජනාධිපති විදේශ නියෝජිතවරියක පිළිගත්තේ ය.

(ii) සමාජ සේවකයෙක් දුප්පත් ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට පොත්-පත් බෙදා දෙයි.

(iii) ඔවුහු අධිකරණ නීති-රීතීන් උල්ලංඝනය කරති.

(iv) කවුරු මේ විශාල වෘක්ෂයන් කපා බිම හෙළත් ද?

(v) කුමරතුඟු මුනිදස්හු 'ව්‍යාකරණ විවරණය' ලියූහ. (ලකුණු 05 යි.)

(ඉ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) අසරණ (මා/මම) වෙනුවෙන් ආධාරයක් කරනු මැනවි.

(ii) (බුද්ධිමතකු/බුද්ධිමතෙක්) වූ සුමනසිරි ධනවතෙක් ද වෙයි.

(iii) මාර්ටින් වික්‍රමසිංහයන් විසින් තුන් ඈඳුතු නවකතා රචනා කරන (ලදි/ලදහ).

(iv) සියලු සත්වයෝ නිදුක් (වේවා/වෙත්වා)!

(v) බොහෝ ධනවන්තයෝ (ශ්‍රද්ධාවන්තයන්/ශ්‍රද්ධාවන්තයෝ) නො වෙති. (ලකුණු 05 යි.)

[හයවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

5. (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල අර්ථ විග්‍රහ කර ලියන්න.

(i) ජයවර්ධන පුරය වනාහි **සකලෛශ්වර්ය** සහිත නගරයක් විය.

(ii) සංවර්ධන ක්‍රියාවලියේ දී **මූලෝත්පාදන** ක්‍රමවේදය ද අවශ්‍ය ය.

(iii) ලංකාවෙහි **පාඨශාලීය** අධ්‍යාපනය තවදුරටත් ක්‍රමවත් කළ යුතු ය. (ලකුණු 03 යි.)

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් සුදුසු තනි පද ලියන්න.

(i) තමාගේ රට නියෝජනය කරමින් විදේශ රටක වසන නිලධාරියා

(ii) භාෂා හයක් පිළිබඳ ගැඹුරු දැනුමක් ඇති තැනැත්තා

(iii) සර්පයන් අල්ලා, නටවමින් ජීවත් වන්නා (ලකුණු 03 යි.)

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) මෙවර රාජ්‍ය සාහිත්‍ය ...................... උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට විධිවිධාන යොදා ඇත.

(ii) වසන්ත කාලයෙහි ඇසෙන කෝකිල ...................... සැමගේ කන් පිනවයි.

(iii) ගල්ලෙන්වල ඇති ...................... බිතුසිතුවම් සංරක්ෂණය කළ යුතු ය.

(iv) අපේ ගමෙහි සාම්ප්‍රදායික ජන ක්‍රීඩාවන්ගෙන් යුතු අලුත් අවුරුදු ...................... පැවැත්විණි.

(v) මනාල යුවළ පෝරුවට නඟින විට බාලිකාවෝ ජය මඟුල් ...................... ගැයූහ.

(vi) සමහර ...................... ගෘහනිර්මාණ ශිල්පීය ලක්ෂණ වර්තමානයේ ද ඇඟයීමට ලක් වේ.

(පුරාණ, උලෙළ, ගීත, උත්සවය, පැරණි, ගී) (ලකුණු 03 යි.)

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස ව්‍යාකරණානුකූල වාක්‍ය බැගින් තනන්න.

(i) ඈ තුන **පහ** යොදා රසවත් ආහාර පිසියි.

(ii) ඔහු සිය දහස් **වර** දිවුරුවේ ය.

(iii) ගොවියා ගස වටා ඇති **පස** බුරුල් කළේ ය.

(iv) ඒ පින්වත් කුමරාගේ **නම** කීර්ති ය.

(v) ඔහු පවුලේ බර සිය **කර** මතට ගත්තේ ය.

(vi) උවැසිය **සල** පතළ මළුවේ වාඩි වූවා ය. (ලකුණු 06 යි.)

6. පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු අංගය** දක්වන්න.

(i) **සඳහිරු** පවත්නා **තුරු** මේ වටිනා වස්තුහු අන්සතු නො **වෙත්වා**! (**සඳහිරු** - සමාස, **තුරු** - නිපාත, **වෙත්වා** - ක්‍රියා)

(ii) **පුරාංගනාවෝ** නුවනත මෙන් ම **වරලස** ද **සුවඳ** ජලයෙන් සේදූහ. (**පුරාංගනා** - සන්ධි, **වරලස** - තද්ධිත, **සුවඳ** - උපසර්ග)

(iii) ජාතික ගීය **ගයද්දී** සියල්ලෝ **ම අසුන්වලින්** නැඟී සිටියහ. (**ගයද්දී**- ක්‍රියා, **ම** - නිපාත, **අසුන්වලින්** - විභක්ති)

(iv) **පෙම්වතා** තම ප්‍රියාවගේ **දෑත** තරයේ ගෙන සවනතට ආදර ගීයක් **මුමුණමින්** ප්‍රීති වූයේ ය. (**පෙම්වතා** - තද්ධිත, **දෑත** - සන්ධි, **මුමුණමින්** - ක්‍රියා)

(v) **සුළඟින් සෙලවුණු** තුරුපත් පෙළ සෙමින් එළිමහන් **රංගභූමියෙහි** පතිත විය. (**සුළඟින්** - විභක්ති, **සෙලවුණු**- කෘදන්ත, **රංගභූමියෙහි** - විභක්ති)

(ලකුණු 15 යි.)

7. (අ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) ප්‍රමාණය ඉක්මවා අහංකාර නොවීම

(ii) උපකාර කළ අයට නපුරුකම් කිරීම

(iii) ඉතා සියුම් ලෙස අන්‍යයන්ට උගුල් ඇටවීම

(iv) අධික කේන්තියෙන් කටයුතු කිරීම

(v) අනවශ්‍ය කතා කරන්නට යාමෙන් අමාරුවේ වැටීම

(vi) රහසින් සිදු කළ දෙයක් බාහිර සාධකවලින් ඔප්පු වීම (ලකුණු 03 යි.)

[හත්වැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

(ආ) පහත දී ඇති රූඪීවල අදහස පැහැදිලි වන සේ වාක්‍යවල යොදන්න.

(i) කළුනික සෙවීම (ii) ඉණ ඉහ විකිණීම
(iii) බොරදියේ මාළු බෑම (iv) පැදුරටත් නොකියා යාම
(v) බහින කලාව (vi) කත් අදිනවා (ලකුණු 03 යි.)

(ඉ) පහත දී ඇති එක් එක් යුගල පදය සෑදී ඇති රටාව කුමක් දැයි දක්වන්න.

(i) අත - පය (ii) දන්නා - හඳුනන
(iii) ජාති - ජන්ම (iv) සිරා - බිරා
(v) ලක - ලැස්ති (vi) යන - එන (ලකුණු 03 යි.)

(ඊ) පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දක්වන්න.

(i) හොමරිකම (ii) නාම්බා
(iii) පෙළවහ (iv) ගස්ගෝනා
(v) ඇඹියො (vi) සිරිප්පානිය (ලකුණු 03 යි.)

(උ) පහත දී ඇති ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත් ලියන්න.

(i) බෙත්ම (ii) ගොළුගල
(iii) මං පොල්ල (iv) ඉල්ලම් කුර
(v) පඬු පොවනවා (vi) කොට්ටෝරුවා (ලකුණු 03 යි.)

8. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අහෝමාප්‍රියප්‍රෙමිලාමාපඤ්චකල්‍යාණියමාමනලෝලියඔබගේතුරුලහැරමරුගේතුරුලටයන්නටඇත්තේතවත්හෝරාකිහිපයක්පමණිමමඅවසන්වරටදඔබදැකගතයුත්තෙමිප්‍රේමියනිසැබවින්මඔබමටනෙතඳුනක්මයරසඳුනක්මයසිතුමිණක්මයඅධරයුග්මයෙන්ඔබගේමුවමීපානයකෙසේවතුදුනේත්‍රයුග්මයෙන්ඔබරූමීපානයකරන්නෙමි·අහෝප්‍රියදස්කොන්මමදඔබගේඅදර්ශනයෙන්චිත්තවෛකල්‍යයටපත්වසිටිමිමාගේයෞවනදේහයෙහිසෞකුමාර්යයවින්දෝත්ඔබමයඅනංගයාගේමල්සරාගේශරප්‍රහාරයෙන්පහරකාසුරතකෙළියෙන්සන්තර්පණයවූවෝත්ඔබමයනාරිදේහනමැතිවිල්ජලයෙහිගිලීකාමදාහයනිවාලූවෝත්ඔබමයදන්නෝඋපාමිණිබැඳිදොරනාරිද්දයනුවෙන්මාඑදාකියූදේඔබසැබෑනොකළෝදකළෝමයමාප්‍රියඹඳඔබකියූවේසැබෑවක්මයපන්දහසකටමැදතිබුණත්උඩළල්ලාරන්භාජනයනොවිදිදවිදිනාගුල්ලාරජුසිතුයේඔහුගේවසඟයෙහිසැමදාඔබසුරක්ෂිතයකියායළහෙත්මාගේදෑත්අතරතහාපපුත්‍රරෙහිඔබසුරක්ෂිතවූබැව්කවුරුදනිත්දමාප්‍රේමියේමියෙනමොහොතෙහිදමාසිත්හිඔබමසිහිකරමිනෙත්හිඔබරුවමඅඳිමිගත්හිඔබරසපහස්මසොයමිමෙසසරපුරාඔබරුව්ගුණමප්‍රාර්ථනාකරමි·

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) 'විකල + ය = වෛකල්‍ය' නම් 'නිෂ්ක්‍රම + ය' යන්න කෙසේ සකස් විය යුතු ද?

(iii) ඝෝෂ මහාප්‍රාණ අක්ෂර සහිත පද දෙකක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(iv) 'අදර්ශන, ප්‍රාර්ථනා' යන වචන රේඵය සහිත ව නැවත ලියන්න.

(v) 'දෑත්' යන්න සන්ධි වන අයුරු පියවරින් පියවර දක්වන්න.

(ලකුණු 15 යි.)

* * *

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2018

## 71 - සිංහල I

### ලකුණු බෙදීයාම

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය. පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

පළමු ප්‍රශ්නය : මෙම ප්‍රශ්නය (අ), (ආ), (ඉ), (ඊ), (උ), (ඌ) යනුවෙන් කොටස් හයකින් සමන්විත ය.

| | | | |
|---|---|---|---|
| (අ), (ආ), (ඉ), (ඊ) | අවබෝධය | - | ලකුණු 16 (4 x 4 = 16) |
| (උ) | අවස්ථා සම්බන්ධය | - | ලකුණු 08 (2 x 4 = 8) |
| (ඌ) | රසාස්වාදය | - | ලකුණු 16 |
| | | | **ලකුණු 40** |

අංක 02 සිට 08 දක්වා ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් සකසා ඇත. ඒ අතුරින් 04කට පිළිතුරු සැපයිය යුතු වේ. එක් ප්‍රශ්නයකට 15 බැගින් ලකුණු 60කි.

**I පත්‍රය සඳහා මුළු ලකුණු = 100කි.**

| | | |
|---|---|---|
| අවසාන ලකුණු ගණනය කිරීම | : | I පත්‍රය 100 |
| | | II පත්‍රය 100 |
| අවසාන ලකුණු | : | 200 ÷ 2 = 100 |

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .


# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ........................................................ ✓ △ $\frac{4}{5}$

(ii) ........................................................ ✓ △ $\frac{3}{5}$

(iii) ........................................................ ✓ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

www.alevelapi.com

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය.
I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.
51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

www.alevelapi.com

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .


1. (අ) සිටාණෝ මුසුප්පුව පියා සිටුදුවණියන්ට කියන්නෝ 'සොඳුර, කුඩා වත් කිම, මහත් වත් කිම? තිලින් එක් කබලුකැවුමක් දීපියව'යි කිවුය. සිටුදුවණියනුත් එකක් හැරගෙන පිළිගන්වන්ට යයි එකක් අල්වාලන්නා ම මහතෙරුන්වහන්සේගේ ආනුභාවයෙන් හැම කබලුකැවුම් ම එකබඳ ව ඇලිණ. සිටුදුවණියෝ එකක් වෙන් කරන්ට උත්සාහ කොටලා 'මේ කබලුකැවුම් පිසීමෙන් වෙන් බව මුත් තිබීමෙන් එක් විය. වෙන් කොටගත නොහැකි ය'යි කිවුය. එසේ වී නම් ඉදොයි කියාලා තුමූත් එකක් වෙන් කරන්ට යත්න කොට වෙන්කොටගත නුහුණුවුය. පිසූ තැනැත්තවුන් හා පිසවූ තැනැත්තවුන් හා දෙන්න එක් ව එකක් වෙන් කොට ගන්ට යත්න කොටත් වෙන්කොටගත නුහුණුවුය. ගත් ආයාසයෙන් ඇඟින් ඩාත් වැගිරෙන්ට වන. කබලු කැමට රිසිත් ගියේ ය. ඉතිකින් දෙන්ටත් සිතාගෙන 'අපට කබලුකැවුම් නොකැමැත්තේ ය. පැසින් ම දීපියව'යි කියා සිටුදුවණියන්ට කිවු ය.

(i) කබලු කැවුම් පිළිගැනීමට පැමිණියේ කවරකු ද?

(ii) එක් කබලු කැවුමක් ගැනීමට තැත් කළ විට සිදු වූයේ කුමක් ද?

(iii) කබලු කැවුම් වෙන් කිරීමට උත්සාහ කරන ලද්දේ කවුරුන් විසින් ද?

(iv) **මුසුප්පුව** හා **පැසින්** යන වචනවල අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

(අ) (i) මුගලන් මහරහතන් වහන්සේ/ මහතෙරුන් වහන්සේ

(ii) මහතෙරුන් වහන්සේගේ ආනුභාවයෙන් හැම කැවුමක් ම (කබලු කැවුම) එකට බැඳී (ඒකාබද්ධව) ඇළිණි

(iii) කබලු පිසූ තැනැත්තා හා පිසවූ තැනැත්තා/මච්ඡරිය කෝසිය සිටුවරයා හා /සිටු බිරිඳ/සිටුවරයා හා සිටු දේවිය/සිටු ඇමෙණිය

(iv) මුසුප්පු - නොසතුටක්/අසන්තෝෂයක්

පැසින් - කූඩයෙන්/පෙට්ටියෙන්

(ආ) බෝධිසත්වයෝ ඒ චන්ද්‍ර කුමාරයනුත් කල් යවා නොයන හෙයින් "එක්තරා අන්තරායෙක් විය යුතු ය"යි තුමූ එතනට ගොස් දෙදෙනා ම විලට බට පියවර සටහන් දැක "මේ විල රාක්ෂසයකු අධිගෘහිත විලක් වුව මැනවැ"යි සිතා කඩුව උරයේ එල්වා ගෙන දුන්න නගා දුනු මිට හීය ලා ගෙන සිටියාහුය. දිය රකුසු බෝධිසත්වයන් දියට නොබස්නා දැක වල දඬු කපා ඇවිදිනා පුරුෂයකු මෙන් තමාගේ ස්වරූපය පාලා බෝධිසත්වයන්ට කියන්නේ "පින්වත් වූ පුරුෂය, තොපි මග ගමන් යාමෙන් මිරිකී ගියව, කුමක් හෙයින් මේ විලට බැස නා පියා පැන් බී නෙළුඹල හා නෙළුඹුදැලි කා මල් පැළඳ සැපසේ නො යවු දැ"යි කිවු ය.

(i) විලට රාක්ෂසයකු අධිගෘහිත බැව් බෝධිසත්වයන් දැන ගත්තේ කෙසේ ද?

(ii) බෝධිසත්වයන් සූදානම් ව සිටියේ කෙසේ ද?

(iii) දිය රකුසා ගත් වේශය කුමක් ද?

(iv) **නෙළුඹල** හා **නෙළුඹුදැලි** යන වචනවල අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

(ආ) (i) සහෝදරයන් දෙදෙනා විලට බසින ලද පා සලකුණු දැකීමෙන්

(ii) කඩුව උරයේ එල්වාගෙන දුන්න ඇද දුනු මිටෙහි ඊතල/ තබා සූදානම් කොට ගෙන

(iii) කැලයේ/වනයේ ලී කැපීමට යන මිනිසකු මෙන්

(iv) නෙළුඹල - නෙලුම් අල

(v) නෙළුඹුදැලි - නෙලුම් ගොබ/නෙලුම් දලු

(ඉ) ඉක්බිති දුටුගැමුණු රජ්ජුරුවෝ ශාලිරාජ කුමාරයන්ට යුවරජ තනතුර දී අනුරාධපුර නුවර දකුණු වීථියෙහි මහත් වූ ප්‍රාසාදයක් කරවා දුන්හ. රාජකුමාරයන් ඒ ප්‍රාසාදයෙහි වසන කල්හි දකුණු දිග ගම්වල පටන් ඒ දිශා භාගයෙහි සියලු දනවු වැසි මනුෂ්‍යයෝ ඒ දිගින් නුවරට නිමන අනෙකප්‍රකාර වූ සියලු ම අයඹුබය රාජකුමාරයන්ට ම ගෙනවුත් දෙති. එකල දවසෙක රාජකුමාරයෝ අටසිල් සමාදන් ව ඉසුරුමුණි විහාරයට ගොස් පෞෂධාංගශීලය ආවර්ජනා කෙරෙමින් උන්හ. ඒ දවස් දකුණු දිශාභාගයෙහි මනුෂ්‍යයෝ සියක් ගැල් පුරා බොහෝ පඬුරු ගෙන්වාගෙන අනුරාධපුරයට යන්නාහු ඉසුරුමුණි විහාරය සමීපයට පැමිණියහ. එකල ගැල් අදනා ගොන් වියකරින් හෙළා ගැල් නො ඇද සිටියහ. මනුෂ්‍යයෝ නොයෙක් උත්සාහ කොට ගැල් පැද යා නො හී සිටියහ.

(i) ශාලිරාජ කුමාරයාගේ ප්‍රාසාදය පිහිටියේ කොහි ද?
(ii) ඉසුරුමුණි විහාරයේ දී ශාලිරාජ කුමාරයන් යෙදී සිටි කාර්යය කුමක් ද?
(iii) එකල ගැල් අදනා ගොනුන් කළේ කුමක් ද?
(iv) **නිමන** හා **ආවර්ජනා** යන වචනවල අර්ථ සපයන්න. (ලකුණු 04 යි.)

(ඉ) (i) අනුරාධපුරයේ දකුණු මාර්ගයේ/විදීයේ
(ii) අටසිල් සමාදන් වී සිටීම/පෙහෙවස් අටසිල් සමාදන් වී /අෂ්ටාංග සීලය සමාදන් වී
(iii) කරත්තයේ විය ගහ බෙල්ලෙන් ඉවත දමා / බෙල්ලෙන් පන්නා ගෙන කරත්තය නො ඇද සිටියේ ය.
(iv) නිවන - ලැබෙන/අයවෙන
ආවර්ජනා - මතක් කරමින් / සිහිපත් කරමින්

(ඊ) කෙළන ළඳුන් සොමි වුවනින් දිනනුවට
මෙන තුරු සෙන් ගෙන එන පුන් තරිඳු හට
නුබ වෙසෙසින් අවසර කර යන ලෙසට
බල යසසින් යනු රිවි බිඹු පැළ'ඹරට

නිබඳ දිළෙන දිනමිණි මැද මිණිනි බඳ
නොමඳ වොරැදි සඳ වෙල අබරණ පැළඳ
පැහැද සොබන පැළ දිග'ඟන දුට සබඳ
එ සඳ සිතෙයි තුඩු රසිනුදුළ තගෙ ළඳ

(i) තාරකා නමැති සේනාව සමග සඳ පැමිණියේ ඇයි?
(ii) බටහිර දිශාව නමැති කාන්තාවගේ ස්වරූපය කවියා ඉදිරිපත් කරන්නේ කෙසේ ද?
(iii) 'දිනමිණි මැද මිණිනි' යන්නෙහි ඇති කාව්‍යාලංකාරය නම් කරන්න.
(iv) '**තුඩු රසිනුදුළ තගෙ ළඳ**' යන්නෙහි අර්ථය පහදා දෙන්න. (ලකුණු 04 යි.)

(ඊ) (i) ක්‍රීඩා කරන කාන්තාවන්ගේ සෞම්‍ය මුහුණු පරාද කිරීම - පරාජය කිරීම සඳහා ය
(ii) නිරන්තරයෙන් බබළන සූර්යයා නැමැති මධ්‍ය මාණික්‍යයෙන්/තරල මිණෙන් බඳින ලද අතිශයින් බබළන සැන්දෑ වළාකුළු නැමැති ආභරණ පැලඳ ගෙන සිටීම
(iii) රූපකාලංකරය/රූපක අලංකාරය
(iv) බබළන රතු හොටක්/හොටයක් ඇති ඔබේ බිරිඳ/භාර්යාව

**(ලකුණු 4 x 4 = 16)**

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "සැවත් නුවර අසවල් වීථියේ මෙනම් සිටුකුලයෙක් ඇත. හඳුනන්නේ ඇද්දැ'යි"

(ii) "සබඳ වැදි පුත්‍රය, සියලු ම මාර්ගෝපකරණ සපයා නිමවන ලද. එබැවින් මේ සියලු උපකරණ පසුඹිය හැර ගනැ"

(iii) "එම්බල කොල මෙතෙක් කල් මා තෙරුන්වහන්සේට දුන් පිළි ගෙන ගියේ තෙපි ම දැ'යි"

(iv) "නුමුත් මම නම් තාම එයාට විතරයි ආදරේ. වෙන කිසි ම කෙනෙකුට ඒ වගේ ආදරේ නෑ."

(v) "ඇහුණා විතරක් නෙමෙයි. මට ඒකෙ තේරුමත් වැටහුණා."

(vi) "අර ඉන්නේ. අර ලී කොටයක් වගේ පාවෙන්නේ කිඹුලා තමයි" (ලකුණු 08 යි.)

(උ) අවස්ථා සම්බන්ධය ලිවීම

(i) දඹදෙණි රාජධානි සමයේ ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ පටාචාරා කථා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. මෙම ප්‍රකාශය පටාචාරා විසින් සැමියා සහ දරුවන් අහිමිව දෙමාපියන්ගේ රැකවරණය පතා යන විට මඟදී හමුවන සැවැත්නුවර සිට එන වැසියෙකුගෙන් අසන ලද්දකි.

(ii) කුරුණෑගල රාජධානි සමයේ රචිත ජාතක පොතෙහි එන ඡද්දන්ත ජාතකයෙන් උපුටා ගන්නා ලද්දකි. ඡද්දන්ත හස්ති රාජයා මරා දළ සඟල ගෙන ඒමට සෝණුත්තර වැද්දා යැවීමට කටයුතු සූදානම් කර අවසන් වූ අවස්ථාවේ සුභද්‍රා රජ බිසව විසින් සෝණුත්තර වැදි පුත්‍රයාට පවසන ලද්දකි.

(iii) ගම්පොළ රාජධානි සමයේ දෙවන ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ ආරඤ්ඤක අභය ස්ථවිර වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. උපාසකයා විසින් හරන්තික සොරා සිවුරු පිළි සමඟ අල්ලා ගත් අවස්ථාවේ දී උපාසක විසින් හරන්තික නම් සොරාට මෙසේ ප්‍රකාශ කරන ලදි.

(iv) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ මළගිය ඇත්තෝ නවකතාවේ ඇතුළත් පාඨයකි. නොරිකො සං ස්වකීය පළමු පෙම්වතා පිළිබඳ තොරතුරු හෙළි කරන අවස්ථාවේ දී දෙවෙන්දොරා සංට මෙසේ පවසයි.

(v) ශ්‍රී හර්ෂදේව රජු විසින් රචනා කරන ලද රත්නාවලී දෘශ්‍ය නාටිකාවේ කදලිගෘහ නම් දෙවන අංකයෙන් උපුටා ගන්නා ලද පාඨයකි. දෑ සමන් වැලේ මල් පිපී දැයි බැලීමට යන උදයන හෙවත් වත්ස රජු හා විදූෂක දෙදෙනාට මූණමල් ගසේ සැඟව සිටි සැලළිහිණියා සාගරිකා හා සුසංගතා අතර ඇති වූ දෙබස පවසන හඬ ඇසෙයි සැලළිහිණියා පවසන්නේ කුමක් දැයි ඇසූ විදූෂකට රජු මෙලෙස පවසයි.

(vi) මාර්ටින් වික්‍රමසිංහ මහතා විසින් රචනා කරන ලද මුදියන්සේ මාමා කෙටි කතාවෙන් උපුටා ගන්නා ලද්දකි. ගුණසීල මුදියන්සේ තම සොහොයුරිය බැලීමට ගොස් ආපසු කොළඹ බලා පිටත් වීමට සූදානම් වූ අවස්ථාවේ ගඟේ මතු වූ කිඹුලකු බැලීමට ගැමි දරුවෝ රැස්වී සිටිති. තමාට කිඹුලකු දිස්වන්නේ නැතැයි මුදියන්සේ පැවසූ විට කළුතරහාමිනේ ඔහුට මෙසේ පවසයි.

**(ලකුණු 2 x 4 = 08)**

(උ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

රන් හැට්ටය හැඳ
රන් පටියෙහි
දිග කඩුව බැඳ,
අසු පිට නැගුණු කුමාරයා
ගම් නියම් ගම් රාජධානි
පසු කොට ගියේ ය.
පස් වසක් ගමන් කළ ඔහු
විවාහ කොටගත් කුමරිය
ගෙන එන්ට
තව පස් වසක් ගත විය.
"එවැනි රුවක් නො දිටිමු"යි
ඈ ගෙනා දින
පුර වැස්සෝ කීහ.
එදින සවස් කල
පුර දොර අසලදී,
රජ ගෙදර
දොරටුපල්ලාගේ දුව
හද්‍රා
කුමරුට හමු විය.
"තී කවුරු ද?"යි
ඔහු විස්මයෙන් ඇසීය.
"තිගේ වැනි රුවක්
මම කිසි කලක නො දිටිමි." (ලකුණු 16 යි

(උ) රුව දැකීම මැයෙන් යුත් මෙම කාව්‍ය නිර්මාණයට වස්තු විෂය වන්නේ මිනිස් සිතෙහි ඇති අසංතෘප්ත ස්වභාවය යි. වසර පහක් ගම් නියම්ගම් රාජධානිවල සැරිසරා විවාහ කොටගත් කුමරිය වසර පහකට පසු මාලිගයට කැඳවා ගෙන ආ දිනයේ දී ම පුරදොර අසල දී රජකුමරුට මුණ ගැසෙන දොරටු පාලයාගේ දියණිය හද්‍රා වඩාත් රූමත් යැ'යි ඔහුට සිතේ. කවියා නිර්මාණය සඳහා යොදා ගත් අනුභූතිය අපූර්වත්වයෙන් යුක්ත ය. එය දාර්ශනික වුත්, මනෝවිද්‍යාත්මක වුත් සංකල්පයකට සමීප වේ.

කාව්‍යානුභූතිය රසිකයා හමුවට ගෙන ඒම සඳහා කවියා යොදා ගන්නා භාෂා ව්‍යවහාරයේ කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් වේ. ධ්වනිතාර්ථවත් භාවය, සංක්ෂිප්තභාවය සහ ආඛ්‍යානමය ස්වරූපය ඒ අතරින් කැපී පෙනෙයි.

උදා :- ''රන් හැට්ටය ඇඳ
රන් පටියෙහි
දිග කඩුව බැඳ
අසුපිට නැගුණු කුමාරයා ''

ආදී යෙදුම්වලින් කුමරාගේ බලය හා තේජස සංක්ෂිප්ත ව ධ්වනිත කෙරෙයි. එසේ ම එම යෙදුම්වලින් සහෘද මනසෙහි සජීව චිත්තරූපයක් ද මැවේ.

''හද්‍ර '' යන යෙදුම තනි ව යෙදීමෙන් ද එම තරුණිය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කෙරෙන බව හැඟේ.

මිනිස් සන්තානගත අතෘප්තිකර ආශාවන්ගේ සීමාවක් නොමැති බව හා කාලයට සාපේක්ෂ ව රුචිකත්වය වෙනස් වන බව ද නිරන්තරයෙන් නෙත ගැටෙන දෙයක අපූර්වත්වයක් නොදකින බව ද ජීවන දෘෂ්ටිය කොටගත් මේ කාව්‍ය නිර්මාණය නිදහස් කාව්‍ය ආකෘතිය යොදා ගනිමින් රචනා වී තිබේ.

ඉහත කරුණු ඇසුරු කර ගනිමින් රසාස්වාදය ලිවීම අපේක්ෂා කරේ.

**(ලකුණු = 16)**

**2.** "සද්ධර්මරත්නාවලිය වූ කලි කථා කීමේ කාර්යය ධර්ම දේශනා කිරීමේ කාර්යයෙන් වෙන් නො කළ කෘතියකි." නියමිත කථා වස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න.

(අ)

www.alevelapi.com

(i) සද්ධර්මරත්නාවලිය පිංකම්හි හැසිර නිවන් සාදා ගන්නට කැමති සත්පුරුෂයන් උදෙසා ලියූ බණකතා කෘතියක් වුව ද එය කථා රසයෙන් අනූන කොට තිබීම විශේෂ ලක්ෂණයකි. එබැවින් මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී කථා පුවත්වල ඇතුළත් ධර්මෝපදේශ මෙන් ම කථා රසය ඇති කරවන පරිදි නිර්මාණය වූ,

- කුතුහලය දනවන අවස්ථා හා සිද්ධි
- සරල කථා රීතිය හා ගැමි වහර
- උපමා රූපක
- කරුණා රසය මෙන් ම හාස්‍ය හා උපහාස රසය ද අවස්ථෝචිත ව යොද ගැනීම ආදී කරුණු නිදසුන් ඇසුරින් පෙන්වා දීම අවශ්‍ය වේ.

නැතහොත්

උගත් නූගත් පාඨක දෙපිරිසේ ම කල්පනා ශක්තිය තියුණු කිරීමටත් දැනුම දියුණු කිරීමටත් ජාතක පොතෙන් ලැබෙන දායකත්වය නියමිත කථා වස්තු **දෙකක්** ඇසුරෙන් පිරික්සන්න. (ලකුණු 15 යි.)

උගත් නූගත් පාඨක දෙපිරිසෙහි ම දැනුම දියුණු කිරීම හා කල්පනා ශක්තිය තියුණු කිරීම සඳහා ජාතක පොතෙන් ලැබෙන අනගි පිටුබලය කෙරෙහි අවධානය යොමු කිරීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

නිර්දිෂ්ට ජාතක කථා අතුරෙන් දෙකක් තෝරා ගෙන ඒවා ඇසුරෙන්

- පුද්ගල චරිතවල ඇතුළත් විවිධ සංකීර්ණතා
- එම චරිත යම් යම් අවස්ථා හා අභියෝගවලට මුහුණ දෙන ආකාරය
- චරිතවලට අදාළ ජීවන පරිසරය
- යෝග්‍ය භාෂා ලක්ෂණ

යන අංග පිළිබඳ ව උගත් නූගත් පාඨකයා හට ලබා දෙන දැනුම හා සම්බන්ධ කරුණු පිළිතුරට ඇතුළත් විය යුතු ය.

එසේ ම එම චරිතවල ක්‍රියාකාරීත්වයේ ප්‍රතිඵල විමසා බැලීම මගින් වඩාත් යහපත් ජීවිතයක් ගත කිරීම මෙලොව පරලොව දෙකෙහි ම සුගතියට හේතු වන බව සිතන්නට උගත් නූගත් පාඨකයන් යොමු කිරීම ජාතක කථාවල විශේෂත්වයකි.

ප්‍රශ්නයේ ඇතුළත් මේ අංශ දෙක ම පිළිතුරට යොදා ගෙන තිබීම අවශ්‍ය වේ.

**3.** "රසය නො පිරිහෙළා කථා ඉදිරිපත් කරන ආකාරයෙන් සද්ධර්මාලංකාරය ශ්‍රාවක - පාඨක දෙපිරිසේ ම සිත් දිනා ගනී." නියමිත කථා වස්තු ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

සද්ධර්මාලංකාරය ශ්‍රාවක පාඨක දෙපිරිසෙහි ම සිත් දිනා ගන්නේ රසවත්භාවය අඩු නො කොට කථා ඉදිරිපත් කිරීමට කතුවරයා දක්වන දක්ෂකම් හේතුවෙනි. මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී,

- ලාංකේය සමාජ පසුබිමෙහි සිදු වූ ඓතිහාසික පුවත්, කථා සඳහා යොදා ගැනීම
- සාලිරාජ, අශෝකමාලා, දුටුගැමුණු, හරන්තික, ආරක්ෂ්කඅභය ආදී චරිත සිත් ගන්නා ආකාරයෙන් නිර්මාණය කිරීම
- කුතුහලය දනවන පරිදිත්, සජීවී ආකාරයෙනුත් අවස්ථා හා සිද්ධි නිර්මාණය කිරීම
- අවස්ථානුකූල ලෙස සරල හා වර්ණනාත්මක භාෂා රීතියක් උපයෝගී කර ගැනීම

යන කරුණු නිදසුන් ඇසුරින් සාකච්ඡා කර තිබීම අවශ්‍ය වේ.

(ලකුණු 15)

**4.** "ගිරා සන්දේශ කතුවරයා ස්වභාව සෞන්දර්යයට බෙහෙවින් ඇලුම් කළ කවියෙකි." වර්ණනා **දෙකක් වත්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

සිංහල සන්දේශ කාව්‍ය කතුවරයාගේ කවිත්වය වඩාත් හොඳින් ඉස්මතු වන්නේත්, වර්ණනාවලට දේශීයත්වයක් ආරෝපණය වන්නේත් ස්වභාව සෞන්දර්ය වර්ණනාවල දී ය. ගිරා සන්දේශයෙහි ද දැකිය හැකි මේ ලක්ෂණය උචිත වර්ණනා ඇසුරින් පෙන්වා දීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ. මෙහි දී ගිරා සන්දේශයේ ඇතුළත් පහත දැක්වෙන වර්ණනාවලින් නිදසුන් ඉදිරිපත් කළ හැකි ය.

**සැඳෑ වැනුම :-**

''විදා සිනිඳු සුදු රැස් දිගු පිය පතර
නඩා සුපුන් හිමකර පියකර තිසර ''
''වියත උදුල කිරණව රළපැහැ පහස
දිගත විසුළ සුර ගඟුලැලි දිසි විලස ''

''තුරුවැළ උදුළ සඳරැස් පිරි නුබ ගැබඳ ''

**උදය වැනුම :-**

''පියුමාකර මඳ මඳ පුබුදින තඹර
ඇසුරුෑකර හෙන බිඟු දැල් දිසි එවර''
''සරණාවි රැවි කෙරේය තුරු සිරේය
පැහැද බිඟු හැසිරේය පුල් සරේය''
''සඳ රැස් වතුරු ලොව පිරෙමින් බසින සඳ
තුරුහිස් අතුරු රැඳි පෙණපෙළ ලෙස විහිද

**වන වැනුම :-**

''දිලිහෙන ගඟුලැලීය ඇද හැලීය''
''නිති වැළලාගෙන තුරු හිමියනි''
''අතු අතිනැද ගසාය තුරු රැසාය ''

ඇතුළු වන වැනුමේ පද්‍ය මේ සඳහා යොදා ගත හැකි ය. එසේ ම තොටගමු විහාරාශ්‍රිත වන වැනුම හා මඟ වැනුමෙහි ඇතුළත් ඇතැම් පද්‍ය ද පිළිතුර සඳහා යොදා ගත හැකි වේ.

උදා :-

''නීලඹරේ වැජඹෙන ගනකුළු ලෙසට
මුදු තෙරේ යන එන නැව් පෙනෙය තට''
''ලක කොමළඟ සමනොළ ගිරි හිසින් ගොතා''
''හළ මනරඟ මිලිගිය මල් දමින් යුතා''

(ලකුණු 15)

www.alevelapi.com

**5.** පුද්ගලයා මුහුණ දෙන ආධ්‍යාත්මික කම්පනයන් කාව්‍යාත්මක ලෙස ප්‍රතිනිර්මාණයෙහි ලා කතුවරයා සමත් වී ඇති ආකාරය මළගිය ඇත්තෝ නවකතාව ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

පුද්ගලයන් මුහුණ දෙන ආධ්‍යාත්මික කම්පනයන් කාව්‍යාත්මක බස් වහරක් ඇසුරු කර ගනිමින් ප්‍රතිනිර්මාණය කිරීම පිළිබඳ 'මළගිය ඇත්තෝ ' නවකතාවෙන් නිදසුන් ගෙන හැර පාමින් විමසා බැලීම මේ පිළිතුරෙන් අපේක්ෂා කෙරේ. ඉතා සියුම් දෙයින් පවා කම්පනයට පත්වන චරිතයක් වූ දෙවෙන්දොරා සං ඔහු පවත්වන සියලු මානව සබඳතාවල දී එය ප්‍රකට කරන අතර, මළගිය ඇත්තෝ කෘතියෙහි විශේෂත්වය වන්නේ ඒ සෑම අවස්ථාවක් ම ළගන්නාසුලු කාව්‍යමය වාග් විලාසයකින් නිරූපණය කිරීම ය.

මේ පිළිතුරෙහි අවධානය යොමු කළ හැකි කරුණු කිහිපයක් පහත දැක්වේ.

- දෙවෙන්දොරා සං ඔහුගේ නවාතැනට නොරිකො සංගේ පැමිණීම අපේක්ෂාවෙන් සිටින අයුරුත්, එහි පැමිණි ඇය වැඩපල කරන අයුරුත් කෙටි වැකි සහිත චිත්තරූප මැවෙන වාග් විලාසයක් භාවිත කරමින් විස්තර කොට තිබීම.
  ' ............. මා උදේ නැගිට වැඩ කරන්නට පටන් ගන්නේ ඈ එන බලාපොරොත්තුවෙන් ය. වෙන දා මෙන්, ලොව දෙස බැලීමට අකැමැත්තෙන්; ........ පැය කිහිපයකින් නොරිකෝ මගේ ඇස් හමුවෙහි සිටී යන බලාපොරොත්තුව ......... '

- දෙවෙන්දොරා සං සහ නොරිකො සං දෙදෙනාගේ ඇසුරට බාධා කරමින් පැමිණෙන ඔකතා සං නිසා එකිනෙකා කෙරෙහි සිත් තුළ හටගන්නා සැක සංකා ඔවුන්ගේ සිත් කම්පනයට ලක් කරන අයුරු දැක්වේ.
  ' ........... මගේ සිතෙහි නොයෙක් විදිහේ සැකසංකා හටගන්ට පටන්ගති. සොහොන්පළක හැසිරෙන හොල්මන් මෙන් ඒවා විකාර වෙස් පාමින් ඔබමොබ දුවන්නට විය. '

- ඊර්ෂ්‍යාව නිසා දෙවෙන්දොරා සං පීඩා විඳින අයුරු දැක්වීම
  ' ........... මුළු තෝකියෝ නගරය ම මා විසින් කඩදාසියෙන් සාදන ලද සෙල්ලම් ගෙයක් සේ එකවර බිඳ වැටුණි.
  ' ........... මා තරප්පු පේළිය දිගේ බොජුන් හලකින් බසින විට, හැරෙන තැන, හදිසියෙන්, විශාල කන්නාඩියක පිළිබිඹු වී තිබෙන මගේ ඡායාව දුටිමි.
  ' ....... මා ගැන මට අනුකම්පා සිතින් මගේ ඇසෙහි කඳුළු පිරිණි ....... '

- නොරිකෝ සං පිළිබඳ අස්ථාන සැකයක් මුල් කර ගෙන දෙවෙන්දොර සං විසින් චෝදනා එල්ල කිරීමෙන් පසු නැවත පහ ව ගිය සංකා ඇති දෙවෙන්දොරා සං ගේ හැසිරීම් දක්වන අයුරු අපූරු පරිසර වර්ණනා ඇසුරින් දැක්වීම.

  ' .......... දවස් කිහිපයක් ම නො කැඩී පැවති හොඳ කාලගුණය හදිසියෙන් මාරු විය. හදිසියෙන් ඇති වූ අකල් වරුසාව නිසා පිපීගෙන ආ සකුරා මල් ඉක්මනින් මැලවේ යැයි මිනිසුන් තුළ බියක් ඇති විය. ..........
  ' .......... ඒ වේලේ මා ජනේලයෙන් පිටත බලන විට, හදිසියෙන් හිම වැටෙන්නට පටන් ගෙන තිබෙන බව දැක මම පුදුම වීමි .......... මල් වරුසාවක් වහින කලක් මෙන් කිරි පාට හිම කැබලි වාතයෙහි පාවෙමින් පොළොවෙහි විසිරිණි. .......... '

- දෙවෙන්දොරාසං කියොතො යාමට සූදානම් වන අවස්ථාවෙහි නොරිකො සංගේ හැසිරීම් විලාසය දොවොන්දොරා සංගේ හැසිරීම් විලාසය, ඔහුගේ සිතෙහි හටගන්නා කම්පනය නිරූපණය කරයි.
  'ඈ නැමී, තම මුහුණ මේසය මත තබා ගත්තා ය.'
  'යනවා නම් දෙවොන්දොරා සංගේ සිරුරේ සුවඳ - මේ ඇඳුම්වල සුවඳ තියලා යන්න' යි මද වේලාවකට පසුව ඇය කීවා ය.
  'ලතිි ලතියේ ග්‍රහණයෙන් ගිලිහී යන සැපතක් ලුහුබැඳ යාමේ දී මා රැස්කළ දුක්ඛ සමුදාය විස ඝොර සැපින්නියක මෙන් හිස ඔසවා මා දෙස බැලීය.'

- තෝකියෝවෙන් හා නොරිකො සංගෙන් සමුගන්නා දෙවෙන්දොරා සං හුදෙකලා ව කියොතොවේ ගත කරන කාලයේ ඔහුට සිහිපත් වන අතීතය දක්වන අයුරු.
  ' .......... සකෙ බිවූ කල මගේ සිත මදක් සැහැල්ලු වේ. ඉන්ද්‍රියන්ට අරමුණු වන රූක්ෂ ලොව එවිට .......... ' හඳ පානෙහි ඈත පෙනෙන කඳුහෙල් මෙන්, මගේ ඇසට ගොදුරු වන්නේ මෘදු රේඛාවල් පමණි. ..........

- නැවත තෝකියෝවට පැමිණෙන දෙවෙන්දොරා සං, නොරිකො සංගේ සුපුරුදු ආශ්‍රය නොමැති වීම නිසා කම්පනයට පත්වන අයුරු නිරූපණය කිරීම.

  ' .......... මා තෝකියෝවට ඇවිත් එහි ගිය අවුරුද්දේ තිබුණ දේ සෙවීම නිෂ්ඵල වෑයමක් බව මට පෙනිණි. ..........කාලය නැමැති සැඩ පහරින් අතීතය සෝදාගෙන ගොස් ය. ..........

- දෙවෙන්දොරා සං ලංකාවට පැමිණීමට පෙර ම නොරිකෝ සංගේ වියෝවීමෙන් ලබන වියෝ දුක අත්විඳින අයුරු නිරූපණය කිරීම

  ' ........... අපි ජීවිතයේ මතුපිට පාවෙමින් ඒ නොගැඹුරු සුවයෙන් තෘප්ත වන්නට වීමු. පතුලෙහි වූ බොරදිය නො කලතා සිටින්නට පරිස්සම් වීමු. එහෙත් ඇතැම්විට නොදැනුවත් ම බොරදිය මතුවේ. ........... ' (පිටුව 120)

- නොරිකොසං සහ දෙවෙන්දොරා සං ඔවුන් අපේක්ෂිත අනාගතය ගැන සිතන හා කතා කරන අවස්ථා

  ' ........... දෙවෙන්දොරාසංගේ ගම රටට ගියා ම අපට පුළුවන් ද මේ විදිහට ජීවත් වෙන්න. ........... '

  ' මොකද බැරි ? ' මා මෙසේ කියන්නේ සිතෙහි හටගන්නා සැකයක් හා ඒ සමඟ ම ඇතිවන වේදනාවක් ද මැඬ ගෙනය.......... ' (පිටුව 119)

- දොවෙන්දොරා සං ලංකාවට පැමිණි පසු නොරිකො සංගෙන් වෙන් වී ගෙවන ජීවිතය නිරූපණය කිරීම

  ' ........... නොරිකොගෙන් ආරංචියක් නො ලැබ සතියක් ගත වුවහොත් මට මහත් කාන්සියක් දැනේ. මට සිතුවමක් ඇඳීමට හෝ වෙන කිසිවක් කිරීමට සිතක් පහළ නොවේ. ........... ' (පිටුව 125)

මේ කරුණු ඇතුළු ව ගැළපෙන වෙනත් නිදර්ශන ද ලියා ඇති නම් සමස්තයක් වශයෙන් සලකා ලකුණු දෙන්න.

**(ලකුණු 15)**

www.alevelapi.com

**6.** තම දරුවන්ගේ අනාගතය පිළිබඳ අපේක්ෂා සහගත වූ දෙමාපියන්ගේ මානසික ස්වභාවය නූතන සිංහල කෙටිකතා රචකයාට විෂය වූ ආකාරය නියමිත කෙටි කතා **තුනක් වත්** ආශ්‍රය කොට ගෙන සාකච්ඡා කරන්න.

(ලකුණු 15 යි.)

දරුවන්ගේ අනාගතය පිළිබඳ අපේක්ෂා සහගත වූ දෙමාපියන්ගේ මානසික ස්වභාවය නිර්දිෂ්ට කෙටිකථා තුනක්වත් ඇසුරින් ඉදිරිපත් කර තිබීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

ඒ සඳහා යොදා ගත හැකි නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

**අපේක්ෂා**

භාග්‍යාගේ මව මෙන් ම අපේක්ෂාගේ මව වන හාමිනා ද තම දියණියගේ අනාගතය පිළිබඳ ව ඉමහත් බලාපොරොත්තු තබා ගෙන සිටීම

- භාග්‍යාගේ මව රැකියාවෙන් පවා අස් වී දරුවන් වෙනුවෙන් තම කාලය හා ශ්‍රමය වැය කිරීම.
- දරුවන් වෙනුවෙන් අමතර පන්ති සඳහා විශාල මුදලක් වැය කිරීම
- විද්‍යා විෂයයන් තෝරා ගැනීමට තම දියණියට මඟ පෙන්වීම
- අපේක්ෂාගේ මව දියණියගේ අනාගතය වෙනුවෙන් මෙහෙකාර සේවයේ යෙදීම
- දියණියට උසස් අධ්‍යාපනයක් ලබා දීමට වෙහෙසීම

**මුදියන්සේ මාමා**

කළුතර හාමිනේ තමාට වත්පොහොසත්කම් නොමැති නිසා මල්ලිගේ තනතුරුවල බලයෙන් දූවරුන් දෙදෙනාට උසස් විවාහයක් කර දීමට බලාපොරොත්තු වීම

**තාත්තා**

- වයස අවුරුදු දොළහේ දී තම පුතා කොළඹ පාසලකට යැවීමට කටයුතු කිරීම
- සියලු ඉඩකඩම් උගසට තබා පුතාගේ අධ්‍යාපනයට වියදම් කිරීම හා ඒ බව කිසිදු විටක තම පුතාට දැන ගන්නට ඉඩ නොතැබීම
- ලේලිය වන සුමනා තමා නිවසට පැමිණීම ගැන නොසතුටක් දක්වන බව දැනගත් වහා පුතාගේ විවාහ ජීවිතයට බාධාවක් නොවන පරිදි රහසින් ම නිවසින් පිටව යාම

**පුතාගේ ශිෂ්‍යත්වය**

- පියදාස ගුණතිලක වාමාංශික අදහස් දැරූ අයෙකු වුවත් තමාගේ ප්‍රතිපත්තිවලට විරුද්ධ වී පුතාට ශිෂ්‍යත්වය ලබා දීමට උත්සාහ ගැනීම .

මේ හැර මාවතේ දරුවෝ, තමන්ගේ දරුවෝ වැනි කෙටි කථාවලින් ද දරුවන් වෙනුවෙන් දෙමාපියන් ගොඩ නැගීමට උත්සාහ ගන්නා අනාගත ලෝකය පිළිබඳ වූ අපේක්ෂා දැකිය හැකි වේ.

(ලකුණු 15)

www.alevelapi.com

**7.** "ජීවිතයේ විවිධ සංක්‍රාන්ති අවස්ථා පිළිබඳ සියුම් නිරීක්ෂණ ශක්තිය ප්‍රකට වීම නූතන සිංහල කවියෙහි කැපී පෙනෙන ලක්ෂණයකි." නියමිත පද්‍ය පන්ති **තුනක් වත්** නිදසුන් කොට දක්වමින් පහදන්න. (ලකුණු 15 යි.)

නූතන සිංහල කවියා ජීවිතයේ විවිධ සංක්‍රාන්ති අවස්ථා නිරූපණය කිරීමට ගත් උත්සාහය පද්‍ය පන්ති තුනක් වත් ඇසුරෙන් දක්වා තිබීම අපේක්ෂා කෙරේ. නිර්දිෂ්ට කෘතියට අයත් අන්ධ කවියා, පරිණාමා, අම්මා, දියණියනි, පිතෘත්වය, එතෙරගිය පොඩි දුවට, වංක ගිරියට මාරුවීම, ලීස්තරවැට ආදී පද්‍ය නිර්මාණ පිළිතුර ලිවීම සඳහා යොදා ගත හැකි ය.

උදා :-

**අන්ධ කවියා**

අන්ධභාවයට පත් පුද්ගලයෙකු තමා අන්ධ වීමට පෙර වින්දනය කළ ප්‍රේමය හා ස්වභාව සෞන්දර්යය පිළිබඳ සංවේදනාවන් සිය දියණිය හමුවේ ප්‍රකාශ කරන ආකාරය පද්‍ය පන්තියට විෂය වී තිබේ. කථකයාගේ ශෝකී ජීවිතය පිළිබඳ ප්‍රකාශන කරුණ රසයක් ජනිත වන පරිදි පද්‍ය පන්තියට යොදා ගෙන තිබේ.

උදා :-

'' දියණිය ඔබ මව මට අමතන්නිය සැග වී හිඳ උණ පඳුරු තුළින්
අමුණා මල් දම් මා ගෙල සරසනු ඈ වැළලූ තැන පිපුණු මලින්''

'' ආලය උල්පත් දෙතැනක පිපිරී මහ ගංගාවක් පරිදි සෙනේ
උතුරා යද්දී නැංවූ සේතුව නොදකී ඇස් දෙක සිතට පෙනේ ''

**පරිණාමා**

ගැහැනියකගේ ජීවිතයේ සන්ධිස්ථාන වශයෙන් ගත හැකි අවස්ථා සජීවී ආකාරයෙන් ප්‍රතිනිර්මාණය කිරීමට දැරූ උත්සහය මේ නිර්මාණයෙන් ප්‍රකට වේ.

''අවසන් වරට මව්සින් ඇය දුටු දවස
ඇය පිරිවරා වැලපුණි හිත ඇති පිරිස ''

**(ලකුණු 15)**

**දියණියනි**

පරිණාමා පද්‍යයෙහි ඇතුළත් ජීවන අවස්ථා මේ නිර්මාණය සඳහා යොදා ගෙන තිබුණ ද කිවිඳියගේ සියුම් නිරීක්ෂණ ශක්තිය මෙහිලා කැපී පෙනෙයි.

කාන්තා ලාලිත්‍යය ඉස්මතු කෙරෙන බස් වහර, ධ්වනිතාර්ථ හා සංකල්පරූප නව්‍ය හා ඖචිත්‍ය භාවයෙන් යුක්ත ය.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .


උදා :-

''තිඹිරිගෙයි දී උඹේ දිගටි ඇස් දුටු විගස ''

'' සොළොස්විය පිරුණු උඹෙ නීල නෙත රුසිරු දැක ''

'' කිරිල්ලිය සේ තුටින් ලොව සරන මුත් මෙනුඹ ''

'' මුවැත්තිය සේ සසල පෙම්වතිය වූ බැවිනි ''

**පිතෘත්වය**

උසස් අධ්‍යාපනය හා එහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන රැකියාව හේතුවෙන් මවු පියන්ගෙන් දුරස්වන පුද්ගලයෙකු තම දියණිය ඇසුරෙන් සිය පියාගේ සෙනෙහස ආවර්ජනය කරන ආකාරය හා පියා දැකබලා ගැනීමට ඔහු තුළ ඇති වන හදිසි ආසාව සාර්ථක ලෙස ප්‍රතිනිර්මාණය කරන අයුරු මෙහි දී දක්නට ලැබේ.

උදා :-

'' ඔහුගේ ඇකයේ උණුසුම දැනුදු දැනෙනවා මා හට
මේ සති අන්තයෙ කෙලෙසින් හෝ මා යා යුතුය ගමට''

**ලීස්තර වැට**

සාම්ප්‍රදායික ආකල්ප අතරෙහි සිරවී බාහිර සමාජය හා නොගැටී හැදී වැඩුණු පුද්ගලයකු වැඩිහිටියකු බවට පත් වූ කල දැඩි හුදකලාභාවයට පත්වන ආකාරය පැදි පෙළෙන් ඉස්මතු වේ.

උදා :-

'' පාළුවෙන් පුරන්වූ ඈත වෙල් එළිය මෙන්
මගේ සිත පුරන් වී ඇත මෙදින ශෝකයෙන් ''

www.alevelapi.com

උචිත වෙනත් නිදසුන් ද පිළිතුර සඳහා යොදා ගත හැකි ය.

**8.** රත්නාවලී නාට්‍යයෙහි ඇතුළත් සාගරිකාගේ චරිතය, නාට්‍ය විකාශනයෙහි ලා උපකාරී වන ආකාරය නිදසුන් ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

රත්නාවලී නාට්‍යයෙහි විකාශනයට බෙහෙවින් ම උපකාරී වී ඇත්තේ රත්නාවලී හෙවත් සාගරිකාගේ චරිතය යි. එම කරුණ පිළිතුර සඳහා යොදා ගැනීමේ දී ඉදිරිපත් කළ හැකි නිදසුන් පහත දැක්වේ.

- සාගරිකා මදන මහෝත්සවයේ දී තමා විවාහ කර දීම සඳහා නියම කර ඇති උදයන රජු දැකීම හා ඔහු පිළිබඳ ස්නේහයෙන්, තැවුලෙන් රජුගේ රුව චිත්‍රයකට නැගීම

- රජු කෙසෙල් උයනේ දී එම චිත්‍රය දැකීම හේතුවෙන් තමාට පෙම් කරන තරුණියක සිටින බව දැන ගැනීම හා ඇය පිළිබඳ ප්‍රේමණීය හැඟීම් ඇති කර ගැනීම

- සුසංගතා විසින් රජුට සාගරිකා හඳුන්වා දෙනු ලැබීම හේතුවෙන් ඔහු ඇය පිළිබඳ දැඩි ප්‍රේමයකින් වෙළී යාම. එතැන් සිට ඇය දකින්නට හා හමුවන්නට ප්‍රාර්ථනා කිරීම

- වාසවදත්තා බිසව සිතුවම දැකීම හේතුවෙන් සැකයක් හා සිත් තැවුලක් ඇති කර ගැනීම හා එනිසා ම රජු පිළිබඳ විමසිලිමත් වීම

- විදූෂක රජු හා සාගරිකා මුණ ගැසීම සඳහා අවස්ථාවක් පිළියෙළ කර දීම

- කාංචනමාලාගේ මාර්ගයෙන් එය දැනගන්නා බිසව එම ස්ථානයට පැමිණ සාගරිකා රැගෙන ගොස් සිර කොට තැබීම

- ඉන්ද්‍රජාලිකයා විදූෂකගේ ඉල්ලීම මත අන්තඃපුරයේ ගින්නක් ඇති කිරීම හා සාගරිකා බේරා ගන්නා ලෙස වාසවදත්තා බිසව රජුගෙන් ඉල්ලා සිටීම.

- සිංහල ඇමතිවරුන් සාගරිකා (රත්නාවලි) හඳුනාගැනීම, වාසවදත්තා සිය සහෝදරිය හඳුනා ගැනීම හා උදයන රජුට ඇය භාර දීම

www.alevelapi.com

මෙබඳු අවස්ථා කිහිපයක් යොදා ගෙන කරුණු දක්වා තිබීම අවශ්‍ය වේ.

(ලකුණු 15)

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .


සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

2019.08.15 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

විභාග අංකය : ...........................

**උපදෙස්:**

* I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* 1 ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මෙම **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. සිංහල වර්ණ මාලාවෙහි එන 'ඕ' යන්න කුමන අක්ෂරයක් ද?
(1) කණ්ඨ තාලුජ (2) දන්තෞෂ්ඨජ (3) කණ්ඨජ
(4) කණ්ඨෞෂ්ඨජ (5) තාලුජ (......)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) කන්කලු, වළාකුළු, දෘෂ්ඨිකෝණය, නිර්මාංස, නිස්සබ්ධ
(2) කන්කළු, වළාකුලු, දෘශ්ටිකෝණය, නිර්මාංෂ, නිශ්ශබ්ධ
(3) කන්කලු, වලාකුලු, දෘස්ඨිකෝණය, නිර්මාංශ, නිෂ්ශබ්ද
(4) කන්කළු, වලාකුළු, දෘෂ්ටිකෝනය, නිර්මාංස, නිශ්ශබ්ද
(5) කන්කලු, වලාකුළු, දෘෂ්ටිකෝණය, නිර්මාංශ, නිශ්ශබ්ද (......)

1.3. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) පතෝල, වම්බටු, තිවිති, තම්පලා (2) කරවිල, පිපිඤ්ඤා, බෝංචි, මැකරල්
(3) වට්ටක්කා, පුහුල්, දඹල, ගොටුකොළ (4) කතුරුමුරුංගා, කොහිල, තුඹ, තිබ්බටු
(5) කොස් ඇට, කංකුන්, කැරට්, මුකුණුවැන්න (......)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) වචනයක ආරම්භක අක්ෂරය සේ විසර්ගය යෙදේ.
(2) විසර්ගය ස්වරයකට පසු ව පමණක් යෙදේ.
(3) විසර්ගය ලිවීමේ දී 'ඃ' ට පූර්වයෙන් 'අ' යන්න යෙදී තිබීම අනිවාර්ය ය.
(4) විසර්ගය ව්‍යඤ්ජනයකට පසු ව පමණක් යෙදේ.
(5) අනුස්වාරය හා විසර්ගය සැම විට ම වචනයක එක සමීපයෙහි යෙදේ. (......)

1.5. රේඵය, රකාරාංශය, යංශය, හා ගයනුකිත්ත සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) පූර්ව, ශාක්‍ය, අක්‍රමික, වනෞෂධ (2) අර්ණව, ඖත්සුක්‍ය, ලෞකික, ආක්‍රමණය
(3) ගර්භ, ප්‍රබල, මනුෂ්‍ය, නෞකාව (4) දුර්වල, මාත්‍රාව, චෞර, නිත්‍යතා
(5) සාර්ථක, ගෞරව, ප්‍රාථමික, පථ්‍ය (......)

1.6. එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) විදුලිය ආලෝකය, භාණ්ඩ සමීක්ෂණය, සංවාද මණ්ඩපය, සම්මන්ත්‍රණ ශාලාව
(2) අයවැය විවාදය, දේශීය ආර්ථිකය, අවුරුදු උලෙළ, වාසනා මන්දිරය
(3) ප්‍රජා අයිතිය, මූල්‍ය කළමනාකරණය, පාරිභෝගික අධිකාරිය, සංවර්ධන ඉලක්ක
(4) දුම් පරීක්ෂණය, පාතාල ලෝකය, උයන් කෙළිය, පරිසර විනාශය
(5) සමාජ අසාධාරණය, මූලධර්ම වාදය, ත්‍රිපිටක අභිවන්දනය, දේශපාලන විචාරකයා (......)

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .


1.7. තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද?
(1) ආභරණ, දෙරණ, උපකරණ, වාරණ (2) ශාලා, ජාලා, ලූලා, මාලා
(3) නිර්ධන, නිර්ගුණ, නිර්මල, නිර්මාණ (4) සකල, සුලකළ, විකල, අකාල
(5) සුමධුර, සුධවල, සුසංවර, සුපෙම්බර (……)

1.8. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් **නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) දුක - සන්තුෂ්ටි, සතුට, ප්‍රීතිය, සන්තෝෂ
(2) අසුර - සුර, දේව, දිව්‍ය, අමර
(3) ආලෝක - අඳුර, කළුවර, අන්ධකාර, තිමිර
(4) ශූර - අලස, කුසීත, කම්මැළි, ඔතැනි
(5) ශීත - උණු, උෂ්ණ, සිසිල්, තාප (……)

1.9. මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.
(1) ඇස - අක්ෂි, නයන, නුවන, නේත්‍ර (2) වතුර - ජලය, පැන්, අඹ, උදක
(3) ලෝකය - ජගත්, දිය, ලෝ, නිජබිම (4) මිතුරා - මිත්‍රයා, යහළුවා, සකිසඳ, හිතවතා
(5) තරුණිය - යුවතිය, යෞවනිය, ළමිස්සි, ගැටිස්සි (……)

1.10. 'යවි, කු, ප, න' යන වර්ගයන්ට අයත් අව්‍යය සමාස පද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) සුසැදි, කුමන්ත්‍රණ, අනියම්, අනුමෝදනා (2) අනියම්, කුමන්ත්‍රණ, සුසැදි, අනුමෝදනා
(3) අනුමෝදනා, සුසැදි, අනියම්, කුමන්ත්‍රණ (4) සුසැදි, අනුමෝදනා, කුමන්ත්‍රණ, අනියම්
(5) අනුමෝදනා, කුමන්ත්‍රණ, සුසැදි, අනියම් (……)

1.11. කෘදන්තයක් **නො වන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) සරන, දරණ, කරන, වරන (2) සිතු, ගෙතු, පැතු, එතු
(3) සැරෙන, පැරෙන, තේරෙන, වැමැරෙන (4) බාදන, වාදන, ඡේදන, වේදන
(5) පැළිලි, බැලිලි, හැළිලි, දිලිලි (……)

1.12. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(අ) "**දමාලා** යන නරක කුණු කය …"
(ආ) "**වයව** තත් සිඳ සිඳ"
(ඉ) "එදා සහසකර පහනෙව් **කරත** හෙළි"
(ඊ) "අව්වේ තියෙන රස්මාලා අඩු **වේවා**!"
(1) අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා, ආශීර්වාදක්‍රියා
(2) පූර්වක්‍රියා, විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා
(3) විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා, පූර්වක්‍රියා
(4) පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, ආශීර්වාදක්‍රියා
(5) විධික්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා (……)

1.13. උක්ත පද දෙකක් හා අනුක්ත පද දෙකක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) සහෝදරයකු, අප, බිරිඳක, ඇතැමෙක් (2) නිවටයකු, නරියෙක්, ගම්වැසියෙක්, අයෙක්
(3) නරපතියෙක්, දූතයකු, කුමාරිකාවක, තා (4) යක්ෂයෙක්, සිඟන්නියක, බලවතකු, පූජකයෙක්
(5) ඇමතියකු, අශ්වයෙක්, කුරුල්ලකු, නාගයකු (……)

1.14. උපසර්ගයක් **යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) දුෂ්කර, දුශ්ශීල, දුෂ්පෝෂණ, දුස්සාධ්‍ය (2) නිදොස්, නිවහල්, නිතරග, නිකැලැල්
(3) පබල, පමොද, පබඳ, පබොද (4) නිරවශේෂ, නිරාගමික, නිරාමිෂ, නිරපේක්ෂ
(5) සුලලිත, සුරිඳු, සුමිතුරු, සුචරිත (……)

1.15. "මගී ජනතාවගේ **ගමනාගමන** කටයුතු **ප්‍රවර්ධනයට** නිලධාරීහු **විධිමත්** පියවර ගනිති" යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) සන්ධි, උපසර්ග හා තද්ධිත (2) උපසර්ග, සන්ධි හා තද්ධිත
(3) සන්ධි, තද්ධිත හා උපසර්ග (4) තද්ධිත, උපසර්ග හා සන්ධි
(5) උපසර්ග, තද්ධිත හා සන්ධි (……)

1.16. ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?
(1) පෙම්ගුලල, හදවිමන, කිතුගොස, සෝගින්න
(2) පුජෝත්සව, මහෝපාධ්‍යාය, අවස්ථෝචිත, මහෝත්තම
(3) අධිකතර, පාපතර, යෝග්‍යතර, ජ්‍යෙෂ්ඨතර
(4) නියත, කියත, විරිත, සිරිත
(5) පෑ, දෑ, නෑ, කෑ (……)

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බෝහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .


1.17. සමාසයක් **නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අහසපොළොව, ධනධාන්‍ය, වැව්මුහුද, පිඟන්කෝප්ප
(2) අනුචිත, අනාගත, අනපේක්ෂිත, අනුල්ලංඝනීය
(3) විනිසකරු, ගොපල්ලා, කම්කරු, අතවැසි
(4) දුදන, දුසිරිත්, දුබල, දුලබ
(5) ඇත්ගාල, රජඅණ, ළමාලොව, සර්පවිෂ (......)

1.18. එක ම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.
(1) පොල්ලත්ත, පත්තිරු, ගොක්කොළ, තිල්ලහස
(2) විවේකාගාරය, ජලාපවහන, රූපකාලංකාරය, ජාතිකෝත්සවය
(3) පුරඟන, නරඟන, දෙවඟන, ගවඟන
(4) නරනිඳු, බමරිඳු, කෙසරිඳු, තෙරිඳු
(5) දෑස, දෑවර, දෑළ, දෑඟිලි (......)

1.19. ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය තෝරන්න.
(1) කේයස් නොහොත් සාගර පලන්සූරිය සුදෝසුදු කාව්‍යය රචනා කළේ ය.
(2) රාජ්‍ය නායකයන් රටක ආදර්ශවත් ව හැසිරිය යුත්තාහ.
(3) විශ්වවිද්‍යාලය ශිෂ්‍යයෝ බොහෝ විට විශ්වවිද්‍යාලයේ නැත.
(4) මානව හිමිකම් සම්බන්ධ නීතීහු කලින් කල වෙනස් වෙයි.
(5) ජනාධිපතිතුමා විසින් විද්වතකු රාජ්‍ය සම්මානයෙන් පුදන ලදි. (......)

1.20. වඩාත් ම නිවැරදි පද බෙදීම සහිත වාක්‍යය තෝරන්න.
(1) අපි නීතිගරුකවූත් සත්‍යගරුකවූත් පුර වැසියෝ ම වෙමු.
(2) සාරධර්ම අධ්‍යයනයෙහි නියුක්ත වූවෝ ගුණවත්වත් නැණවත්වත් ජීවත් වෙති.
(3) ඒ කාරණය එ සේ ම විය යුතු යැයි ඔහු අවධාරණය කළේ ය.
(4) එම ආයතනයෙහි පාලනය නොවිධිමත් හෙයින් මුදල් වෙන් නොකෙරිණි.
(5) "අපි ම මෙකී කාර්යය ඉටු කරමු"යි ඔවුහු උදක් ම උදම් ඇනූහ. (......)

(ලකුණු 20 යි.)

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019

පැරණි නිර්දේශය/ பழைய பாடத்திட்டம்

II පත්‍රය

විෂය අංකය / பாட இலக்கம்: 71

විෂයය / பாடம்: සිංහල

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I කොටස

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|
| 01. | 4 | 11. | 1 |
| 02. | 5 | 12. | 2 |
| 03. | 2 | 13. | 4 |
| 04. | 2 | 14. | 5 |
| 05. | 3 | 15. | 1 |
| 06. | 5 | 16. | 4 |
| 07. | 3 | 17. | 1 |
| 08. | 5 | 18. | 5 |
| 09. | 3 | 19. | 3 |
| 10. | 5 | 20. | 5 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 20 = 20

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .


## II කොටස

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලෝකයේ බොහෝ රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද වැඩිහිටි ජනගහන ප්‍රතිශතය ඉහළ යාමේ සමාජ අර්බුදයට මුහුණ දෙමින් සිටී. මෙම වැඩිහිටියන්ට රැකවරණය සැලසීම සම්බන්ධයෙන් වර්තමානයේ ප්‍රබල සමාජ මතයක් ගොඩනැගෙමින් පවතී. බටහිර රටවලටත් ඇතැම් පෙරදිග රටවලටත් වඩා ශ්‍රී ලාංකේය පවුල හා ප්‍රජාව තුළ වැඩිහිටියන් රැකබලා ගැනීමට අදාළ ව ක්‍රියාත්මක වූ ප්‍රජාපාදක ආරක්ෂිත ජාලයක් පැවති බව සාම්ප්‍රදායික සමාජ රටාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. වර්තමානයේ පවා බොහෝ වැඩිහිටියන් තම දරුමුණුබුරන් හෝ ඥාතීන් සමග ජීවත් වීමට වැඩි කැමැත්තක් දක්වන බව සමාජ පර්යේෂකයෝ පවසති. සාඵල්‍යතාව අඩුවීම නිසා දරුවන්ගේ ප්‍රමාණය පහළ යාම, දේශීය හා විදේශීය සංක්‍රමණ, නාගරීකරණය හා කාන්තාවන් රැකියාවල නිරත වීම ආදි සාධකවල සෘජු බලපෑම නිසා පවුල කේන්ද්‍රීය ව ක්‍රියාත්මක වූ වැඩිහිටියන් රැකබලා ගැනීමේ ක්‍රියාවලිය වර්තමානයේ අභියෝගයකට ලක් වෙමින් පවතී. බොහෝ පර්යේෂකයන් පෙන්වා දෙන පරිදි ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි සිදුවන ප්‍රජාවිද්‍යාත්මක හා සමාජ, ආර්ථික වෙනස්කම් හේතුවෙන් හටගැනෙන පවුල් විසංවිධානය නිසා වියපත් වූවන්ගේ රැකවරණය සඳහා පවුල තුළ සක්‍රිය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වීමට බාධා මතු වේ. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා තදනුබද්ධ ධනාත්මක ලක්ෂණ, යටිතල පහසුකම් හා අවශේෂ සේවාවන් ප්‍රවර්ධනය කිරීමටත් කළමනාකරණ ක්‍රියාවලිය වඩාත් විධිමත් කිරීමටත් කාර්ය මණ්ඩලයට නිසි පුහුණුවක් ලබා දීමටත් අවශ්‍ය කටයුතු සම්පාදනය වුවහොත් මෙරට සංස්කෘතියට හා සමාජ ව්‍යුහයට ගැළපෙන ආකෘතියක් ගොඩනගා ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත. වියපත් වූවන් හැකිතාක් දුරට රටේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ කොටස්කරුවන් බවට පත් කර ගැනීමට ප්‍රතිපත්ති සැකසීම ඔවුන්ගේ කායික හා මානසික සෞඛ්‍යය යහපත් වීමටත් රටේ සංවර්ධන ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් වීමටත් බලපානු ඇත.

(i) සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජයේ වැඩිහිටියන් රැකබලා ගැනීම උදෙසා ක්‍රියාත්මක වූ වැඩපිළිවෙළ ලේඛකයා හඳුන්වන්නේ කවර නමකින් ද?

(ii) වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා අතීතයේ පැවති ක්‍රියාවලිය වර්තමානයේ අභියෝගයකට ලක් ව ඇත්තේ කවර කරුණු හේතුවෙන් ද?

(iii) වියපත් වූවන්ගේ කායික හා මානසික සෞඛ්‍යය යහපත් කිරීම උදෙසා ලේඛකයා යෝජනා කරන්නේ කුමක් ද?

(iv) මෙම පාඨයෙහි සඳහන් වන ආකාරයට මෙරට සංස්කෘතියට හා සමාජ ව්‍යුහයට ගැළපෙන ආකෘතියක් ගොඩනගා ගැනීමට සම්පාදනය විය යුතු අවශ්‍යතා මොනවා ද?

(v) වියපත් වූවන්ගේ රැකවරණය සඳහා පවුල තුළ සක්‍රිය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වීමට බාධාව වශයෙන් සමාජ පර්යේෂකයන් දක්වන්නේ කුමක් ද?

(ලකුණු 10 යි.)

www.alevelapi.com

(අ) සඳහා පිළිතුරු

i. ප්‍රජාපාදක ආරක්ෂිත ජාලය යන නාමයෙන්

ii. 1. සාඵල්‍යතාව අඩු වීම නිසා දරුවන්ගේ ප්‍රමාණය පහළ යාම

2. දේශීය හා විදේශීය සංක්‍රමණ

3. නාගරීකරණය

4. කාන්තාවන් රැකියාවල නිරත වීම

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02කි. කොටස් 02ක් හෝ 03ක් හෝ ඇත්නම් ලකුණු 01කි.**

**එක් කොටසක් පමණක් ඇත්නම් ලකුණු හිමි නො වේ.)**

iii. වියපත් වූවන් හැකිතාක් දුරට රටේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ කොටස්කරුවන් බවට පත් කර ගැනීමට ප්‍රතිපත්ති සැකසීම

iv 1. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා තදනුබද්ධ ධනාත්මක ලක්ෂණ

2. යටිතල පහසුකම් හා අවශේෂ සේවාවන් ප්‍රවර්ධනය කිරීම

3. කළමනාකරණ ක්‍රියාවලිය වඩාත් විධිමත් කිරීම

4. කාර්ය මණ්ඩලයට නිසි පුහුණුවක් ලබා දීම

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02කි. කොටස් 02ක් හෝ 03ක් හෝ ඇත්නම් ලකුණු 01කි. එක් කොටසක් පමණක් ඇත්නම් ලකුණු හිමි නො වේ.)**

v. පවුල් විසංවිධානය / ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි සිදුවන ප්‍රජාවිද්‍යාත්මක හා සමාජ, ආර්ථික වෙනස්කම් හේතුවෙන් හටගැනෙන පවුල් විසංවිධානය නිසා

**(ලකුණු 02 x 5 = 10යි.)**

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සහභාගිත්ව සංවර්ධනය බිහිවන්නේ දුප්පත් ජනතාවගේ ස්වශක්තිය, සහභාගිත්වය එක්වී බිහි වන නිර්මාණනීය නව උත්පාදන ශක්තිය තුළිනි. එහෙයින් ම මෙම සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලිය අතිශයින් ම ගැඹුරු වනු පෙනේ. එමෙන් ම අර්ථවත් වනු දිසේ. අනෙක් අතට ජනතා පදනමක් ද එහිලා පැනේ. එමතු ද නොව පවත්නා සාම්ප්‍රදායික සංවර්ධනය වෙනුවට බිහිවන විකල්ප සංවර්ධන ක්‍රියාවලියක් ද වනු ඇත. සහභාගිත්ව සංවර්ධනය බාහිර මූල්‍යාධාර, මහජන ප්‍රයෝජනයට අදාළ විවිධ සහනාධාර හෝ වෙනත් ද්‍රව්‍යමය ආධාර ආදිය අපේක්ෂාවෙන් ආරම්භ කරනු ලබන සංවර්ධන ක්‍රියාදාමයක් නම් නො වේ. සාම්ප්‍රදායික සංවර්ධනයේ දී දිළිඳු ජනතාවගේ නිර්මාණ ශක්තිය මතු වීමට පෙරාතුව ම බාහිර ආධාර ඉස්මතු වෙයි. ඒ සමග ම නැගී එන අංකුර නවෝත්පාදන දහරා වියැකී යයි. නමුත් සහභාගිත්ව සංවර්ධනයේ දී බාහිර ආධාරයන් මත නොව ජනතාවගේ ස්වශක්තිය හා සහභාගිත්වය එක්වීමෙන් බිහිවන නිර්මාණ ශක්තිය සංවර්ධනයේ ඒකායන බලවේගය බවට පත් වෙයි. බාහිර ආධාර සහ සහනාධාර මත පදනම් වූ වැඩසටහන් එම ආධාර ලැබීම් නැවැතීමත් සමග ම ඇණ හිටී. නැතහොත් අතුරුදහන් වනු ඇත. නමුත් සහභාගිත්ව සංවර්ධනයේ දී එසේ නොවන්නේ ජනතාවගේ නිර්මාණාත්මක නවෝත්පාදන ශක්තිය ඒ වන විට වර්ධනය වී සියත් බව තුළ සහභාගිත්වයේ ම රැඳෙන බැවිනි. මේ නිසා සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලියේ දී රජයෙන් ලැබෙන ආධාර, වෙනත් සහනාධාර, බැංකු ණය ප්‍රතික්ෂේප කරන්නේ ය යන පටු හැඟීමක් ඇති වීමට ඉඩ තිබේ. එහෙත් එය එසේ නො වේ. එය සමස්තයක් වශයෙන් ම වැරදි සහිත වෙයි.

(ලකුණු 15 යි.)

(ආ) සාරාංශය (වචන 60 - 70)

- සහභාගිත්ව සංවර්ධනය ජනිත වන්නේ දුප්පත් ජනතාවගේ නිර්මාණනීය නව උත්පාදන ශක්තිය තුළින් වන අතර එය අතිශය ගැඹුරු ක්‍රියාවලියකි.

- එය පවත්නා සාම්ප්‍රදායික සංවර්ධනය වෙනුවට බිහිවන විකල්පයක් වීම

- මෙය බාහිර මූල්‍යාධාර, මහජන ප්‍රයෝජනයට අදාළ විවිධ සහනාධාර හෝ වෙනත් ද්‍රව්‍යමය ආධාර ආදිය අපේක්ෂාවෙන් ආරම්භ වූ ක්‍රියාදාමයක් නොවීම

- ජනතාවගේ ස්වශක්තිය හා සහභාගිත්වය එක්වීමෙන් බිහිවන නිර්මාණ ශක්තිය සංවර්ධනයේ ඒකායන බලවේගය වීම

- විවිධ ආධාර මත යැපෙන වැඩසටහන්, ඒවා නොලැබීමෙන් නැවතුණත් සහභාගිත්ව සංවර්ධනයේ දී එසේ නොවන්නේ ජනතාවගේ නවෝත්පාදන ශක්තිය වර්ධනය වී සියත් බව තුළ රැඳෙන බැවින් වීම

- මෙහි ලා විවිධ සහනාධාර අපේක්ෂා නොකරන නමුත් රාජ්‍ය ආධාර, බැංකු ණය ආදිය සහභාගිත්ව සංවර්ධනයේ දී ප්‍රතික්ෂේප කරන්නේ ය යන්න සමස්තයක් වශයෙන් වැරදි අදහසක් වීම

**ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර ඡේදවලට බෙදා ඇත්නම් සමස්තයෙන් ලකුණු 02ක් අඩු වේ. වචන සංඛ්‍යාව 60 - 70 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි හෝ වේ නම් ලකුණු 03ක් අඩු වේ.**

| | | |
|---|---|---|
| **සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට** | - | **ලකුණු 03 යි.** |
| **අක්ෂර වින්‍යාසයට** | - | **ලකුණු 04 යි.** |
| **අන්තර්ගතයට** | - | **ලකුණු 08 යි.** |

**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) දේශපාලන අරගල, මැතිවරණ සහ ශ්‍රී ලංකාවේ අනාගත අභියෝග

(ii) ගෝලීය ත්‍රස්තවාදය මැඩපැවැත්වීමට ලෝක බලවතුන් මැදිහත් වීමේ අවශ්‍යතාව

(iii) භාෂාව, සාහිත්‍යය මෙන් ම ඉතිහාසය ද හැදෑරීමට පාසල් ශිෂ්‍යයන් යොමු කරවීමේ කාලෝචිත බව

(iv) ජයග්‍රහණය ම නො ව කායික - මානසික සෞඛ්‍ය වර්ධනය ද ක්‍රීඩාවේ පරමාර්ථවලින් එකකි.

(v) මෙරට පාසල් ශිෂ්‍යයන්ගේ නව නිපැයුම් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට යොදා ගැනීමේ යෝග්‍යතාව

(vi) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාව නගරවලට සංක්‍රමණය වීමෙන් ඇති විය හැකි සමාජීය හා සංස්කෘතික අර්බුද (ලකුණු 25 යි.)

03. **වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකි ය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ.**

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය
ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
iii. කරුණුවල පැහැදිලි බව
iv. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම
v. ව්‍යාකරණ දෝෂ රහිත වීම
vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම
vii. සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම
viii. කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම

- විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) මේ කර්මාන්ත ශාලාවෙහි ඉතා දක්ෂ සේවකයන් ඇත.
(ii) අනාථ නිවාස පාලිකාව ඔහු දරුවෙක් මෙන් ඇති දැඩි කළා ය.
(iii) අපි වෙනුවෙන් වැඩ කිරීම සඳහා අපි ම පෙළ ගැසෙමු.
(iv) 'වීරාභිවන්දන' උලෙළේ දී ඇමතිතුමා විසින් ජාතික වීරයෝ ඇගයෙති.
(v) තනතුරු ලෝභයෙන් කටයුතු කරන්නෝ ආත්මාර්ථකාමීන් වෙති. (ලකුණු 05 යි.)

04. (අ)

i. මේ කර්මාන්ත ශාලාවෙහි ඉතා දක්ෂ සේවකයෝ ඇත.
ii. අනාථ නිවාස පාලිකාව ඔහු දරුවකු /දරුවෙකු මෙන් ඇති දැඩි කළා ය.
iii. අප වෙනුවෙන් වැඩ කිරීම සඳහා අපි ම පෙළ ගැසෙමු.
iv. නිවැරදි වැකියකි.
v. තනතුරු ලෝභයෙන් කටයුතු කරන්නෝ ආත්මාර්ථකාමීහු /ආත්මාර්ථකාමියෝ වෙති.

**(ලකුණු 01 x 5 = 05 යි.)**

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) ජනාධිපති විදේශ නියෝජිතවරියක පිළිගත්තේ ය.
(ii) සමාජ සේවකයෙක් දුප්පත් ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට පොත්-පත් බෙදා දෙයි.
(iii) ඔවුහු අධිකරණ නීති-රීතීන් උල්ලංඝනය කරති.
(iv) කවුරු මේ විශාල වෘක්ෂයන් කපා බිම හෙළත් ද?
(v) කුමරතුඟු මුනිදස්හු 'ව්‍යාකරණ විවරණය' ලියූහ. (ලකුණු 05 යි.)

(ආ)

i. ජනාධිපති විසින් විදේශ නියෝජිතවරියක් / පිළිගැනිණි / පිළිගැනුණා ය / පිළිගනු ලැබුවා ය / පිළිගන්නා ලද්දී ය.
ii. සමාජ සේවකයකු විසින් දුප්පත් ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට පොත්-පත් බෙදා දෙනු ලබයි / ලැබෙයි.
iii. ඔවුන් විසින් අධිකරණ නීති-රීතීහු උල්ලංඝනය කෙරෙති / කෙරෙත් / කරනු ලබත් / ලැබෙත් / ලබති / ලැබෙති.
iv. කවුරුන් විසින් මේ විශාල වෘක්ෂයෝ කපා බිම හෙළෙත් ද? / හෙළනු ලැබෙත් ද? / ලබත් ද?
v. කුමරතුඟු මුනිදසුන් විසින් 'ව්‍යාකරණ විවරණය' ලියැවිණි / ලියැවුණේ ය /ලියනු ලැබිණ / ලැබිණි / ලැබුණේ ය / ලැබුවේ ය / ලැබී ය / ලියන ලද්දේ ය / ලියනා ලද්දේ ය / ලියන ලදි / ලියනා ලදි.

**(ලකුණු 01 x 5 = 05 යි.)**

(ඉ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.
(i) අසරණ (මා/මම) වෙනුවෙන් ආධාරයක් කරනු මැනවි.
(ii) (බුද්ධිමතකු/බුද්ධිමතෙක්) වූ සුමනසිරි ධනවතෙක් ද වෙයි.
(iii) මාර්ටින් වික්‍රමසිංහයන් විසින් තුන් ඇඳුතු නවකතා රචනා කරන (ලදි/ලදහ).
(iv) සියලු සත්වයෝ නිදුක් (වේවා/වෙත්වා)!
(v) බොහෝ ධනවන්තයෝ (ශ්‍රද්ධාවන්තයන්/ශ්‍රද්ධාවන්තයෝ) නො වෙති. (ලකුණු 05 යි.)

(ඉ)

i. මා

ii. බුද්ධිමතකු

iii. ලදි

iv. වෙත්වා

v. ශ්‍රද්ධාවන්තයෝ

**(ලකුණු** 01 **x 5 = 05 යි.)**

**5.** (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල අර්ථ විග්‍රහ කර ලියන්න.
(i) ජයවර්ධන පුරය වනාහි **සකලෛශ්වර්ය** සහිත නගරයක් විය.
(ii) සංවර්ධන ක්‍රියාවලියේ දී **මූලෝත්පාදන** ක්‍රමවේදය ද අවශ්‍ය ය.
(iii) ලංකාවෙහි **පාඨශාලීය** අධ්‍යාපනය තවදුරටත් ක්‍රමවත් කළ යුතු ය. (ලකුණු 03 යි.)

i. සියලු යස ඉසුරු / සියලු සැප සම්පත්

ii. මුදල් උපයා ගැනීම / මුදල් ඉපදවීම

iii. පාසලට අයත් / පාසල හා බැඳුණු / පාසල හා සම්බන්ධ

**(ලකුණු** 01 **x 3 = 03 යි.)**

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් සුදුසු තනි පද ලියන්න.
(i) තමාගේ රට නියෝජනය කරමින් විදේශ රටක වසන නිලධාරියා
(ii) භාෂා හයක් පිළිබඳ ගැඹුරු දැනුමක් ඇති තැනැත්තා
(iii) සර්පයන් අල්ලා, නටවමින් ජීවත් වන්නා (ලකුණු 03 යි.)

i. තානාපති

ii. ෂඩ්භාෂාපරමේශ්වර / සබස්පරමිසුරු

iii. අහිගුණ්ඨිකයා / අහිකුණ්ඨිකයා

**(ලකුණු** 01 **x 3 = 03 යි.)**

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) මෙවර රාජ්‍ය සාහිත්‍ය ...................... උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට විධිවිධාන යොදා ඇත.

(ii) වසන්ත කාලයෙහි ඇසෙන කෝකිල ...................... සැමගේ කන් පිනවයි.

(iii) ගල්ලෙන්වල ඇති ...................... බිතුසිතුවම් සංරක්ෂණය කළ යුතු ය.

(iv) අපේ ගමෙහි සාම්ප්‍රදායික ජන ක්‍රීඩාවන්ගෙන් යුතු අලුත් අවුරුදු ...................... පැවැත්විණි.

(v) මනාල යුවළ පෝරුවට නගින විට බාලිකාවෝ ජය මඟුල් ...................... ගැයූහ.

(vi) සමහර ...................... ගෘහනිර්මාණ ශිල්පීය ලක්ෂණ වර්තමානයේ ද ඇගයීමට ලක් වේ.

(පුරාණ, උලෙළ, ගීත, උත්සවය, පැරණි, ගී) (ලකුණු 03 යි.)

i. උත්සවය

ii. ගීත

iii. පැරණි

iv. උලෙළ

v. ගී

vi. පුරාණ

**(ලකුණු ½ x 6 = 03 යි.)**

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස ව්‍යාකරණානුකූල වාක්‍යය බැගින් තනන්න.

(i) ඈ තුන **පහ** යොදා රසවත් ආහාර පිසියි.

(ii) ඔහු සිය දහස් **වර** දිවුරුවේ ය.

(iii) ගොවියා ගස වටා ඇති **පස** බුරුල් කළේ ය.

(iv) ඒ පින්වත් කුමරාගේ **නම** කීර්ති ය.

(v) ඔහු පවුලේ බර සිය **කර** මතට ගත්තේ ය.

(vi) උවැසිය **සල** පතළ මළුවේ වාඩි වූවා ය. (ලකුණු 06 යි.)

i. පහ - (සංඛ්‍යාවාචී) ප්‍රාසාදය, පැහැය, ස්පර්ශය, අපගත (ඉවත් ව යාම), ප්‍රහීණ

ii. වර - (අවස්ථාව) උතුම්, වරපට, ස්වාමියා, යාච්ඤාව, ආවරණය, දවස, දෙවියන්ගෙන් ලබන බලය, දුනු දිය, ස්වභාවය, අසපුව, විධි ක්‍රියා

iii. පස - (පස්) පහ, ප්‍රදේශය, පසු ව, පක්ෂය, ප්‍රත්‍යය, පාර්ශ්වය, හේතුව, පාශය, මූත්‍ර, දාදුකැටය

iv. නම - (නාමය) නමය, නැමීම, පූජ්‍ය/පූජක තැන, විධික්‍රියා

v. කර - (උරහිස) දැළිපිහිය, රශ්මිය, පිළිස්සීම, අත, ඇත්සොඬය, කර ගස, අය බදු, නැටුම, හිරගෙදර, කරගැටය, මුහුද, භ්‍රමණය, කර්කශ, මැර, ලුණු, බූරුවා, ඔප්පුව, පූර්වක්‍රියා

vi. සල - (ගල්) චඤ්චල, ප්‍රමාදය, චිරකාලය, ශාලාව, ඉත්තෑවා, විධික්‍රියාව

**(ලකුණු 01 x 6 = 06 යි.)**

**6.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු අංගය** දක්වන්න.

(i) **සඳහිරු** පවත්නා **තුරු** මේ වටිනා වස්තුහු අන්සතු නො **වෙත්වා!** (**සඳහිරු** - සමාස, **තුරු** - නිපාත, **වෙත්වා** - ක්‍රියා)

(ii) **පුරාංගනාවෝ** නුවනත මෙන් ම **වරලස** ද **සුවඳ** ජලයෙන් සේදූහ. (**පුරාංගනා** - සන්ධි, **වරලස** - තද්ධිත, **සුවඳ** - උපසර්ග)

(iii) ජාතික ගීය **ගයද්දී** සියල්ලෝ **ම** **අසුන්වලින්** නැඟී සිටියහ. (**ගයද්දී**-ක්‍රියා, **ම** - නිපාත, **අසුන්වලින්** - විභක්ති)

(iv) **පෙම්වතා** තම ප්‍රියාවගේ **දෑත** තරයේ ගෙන සවනතට ආදර ගීයක් **මුමුණමින්** ප්‍රීති වූයේ ය. (**පෙම්වතා** - තද්ධිත, **දෑත** - සන්ධි, **මුමුණමින්** - ක්‍රියා)

(v) **සුළඟින්** **සෙලවුණු** තුරුපත් පෙළ සෙමින් එළිමහන් **රංගභූමියෙහි** පතිත විය. (**සුළඟින්** - විභක්ති, **සෙලවුණු**- කෘදන්ත, **රංගභූමියෙහි** - විභක්ති)

(ලකුණු 15 යි.)

| වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
|---|---|---|
| i සඳහිරු | සමාස | ද අරුත් සමස් / ද කාරාර්ථ / ද්වන්ද / චාර්ථ සමාසය |
| තුරු | නිපාත | සීමා අර්ථය |
| වෙත්වා | ක්‍රියා | ආසි කිරිය / ආශීර්වාද / ප්‍රාර්ථනා ක්‍රියා |
| ii පුරාංගනාවෝ | සන්ධි | සමාන ස්වර දීර්ඝ / සවර්ණ ස්වර දීර්ඝ / ස්වර දීර්ඝ |
| වරලස | තද්ධිත | ස්වාර්ථය / එය ම යන අර්ථය |
| සුවඳ | උපසර්ග | වඩා යන අර්ථය / අධික යන අර්ථය / අර්ථෝද්දීපනය කිරීම් අර්ථය / භූෂණාර්ථය |
| iii ගයද්දී | ක්‍රියා | අසම්භාව්‍ය ක්‍රියා / අසබහව් කිරිය /කාලාර්ථ අසම්භාව්‍ය ක්‍රියාව / කල් අරුත් අසබහව් කිරිය |
| ම | නිපාත | අවධාරණ අර්ථය |
| අසුන්වලින් | විභක්ති | අවධි විභක්තිය / අවදි විබත් / පඤ්චමී විභක්තිය |
| iv පෙම්වතා | තද්ධිත | අස්ත්‍යර්ථය / ඇත යන අර්ථය |
| දෑත | සන්ධි | ස්වරාදේශ සන්ධි / සරදෙස් සඳ |
| මුමුණමින් | ක්‍රියා | මිශ්‍ර ක්‍රියා / මුසු කිරිය |
| v සුළඟින් | විභක්ති | කරණ විභක්තිය / කරණ විබත් |
| සෙලවුණු | කෘදන්ත | අතීත කෘදන්ත /කර්මකාරක අතීත කෘදන්ත |
| රංගභූමියෙහි | විභක්ති | අදර විබත් / ආධාර විභක්තිය / සප්තමී විභක්තිය |

**(ලකුණු (01 x 3) x 5 = 15 යි.)**

7. (අ) පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) ප්‍රමාණය ඉක්මවා අහංකාර නොවීම
(ii) උපකාර කළ අයට නපුරුකම් කිරීම
(iii) ඉතා සියුම් ලෙස අන්‍යයන්ට උගුල් ඇටවීම
(iv) අධික කේන්තියෙන් කටයුතු කිරීම
(v) අනවශ්‍ය කතා කරන්නට යාමෙන් අමාරුවේ වැටීම
(vi) රහසින් සිදු කළ දෙයක් බාහිර සාධකවලින් ඔප්පු වීම (ලකුණු 03 යි.)

(අ)

i. ඇඟිල්ලේ තරමට ඉදිමෙනව වාගේ

ii. නැග්ග ඉණිමගට පයින් ගහනවා වාගේ
කන්න දුන්නු අත හපා කන්නා වාගේ
හෙළ පහු වුණා ම හැරමිටිය විසි කරනවා වාගේ

iii. දිය රෙද්දෙන් බෙල්ල කපනවා වාගේ
දිය යටින් ගින්දර ගෙන යනවා වාගේ

iv. හොස්ස ළඟින් මැස්ස යන්න බෑ වාගේ

v. මාළුවා නහින්නේ උගේ කට හින්දාලු
අනුන්ගේ සීනි කිරන්න යනවා වාගේ
නොදන්න දෙමළෙට ගිහින් වරිගේ නසා ගන්නවා වාගේ

vi. පුහුල් හොරා කරෙන් දැනේ
අබ කෑ මිනිහාගේ මොළය දනවා වාගේ

**(ලකුණු ½ x 6 = 03 යි.)**

(ආ) පහත දී ඇති රූපිවල අදහස පැහැදිලි වන සේ වාක්‍යවල යොදන්න.

(i) කළුනික සෙවීම (ii) ඉණ ඉහ විකිණීම
(iii) බොරදියේ මාළු බෑම (iv) පැදුරටත් නොකියා යාම
(v) බහින කලාව (vi) කත් අදිනවා (ලකුණු 03 යි.)

i. දුර්ලභ දෙයක් සෙවීම
ii. සියලු සම්පත් වැය කිරීම / තමා සතු සියල්ල අහිමි කර ගැනීම / සියලු සම්පත් නැති කර ගැනීම
iii. අයුතු ප්‍රයෝජන ගැනීම / යමකු විපතට පත් වූ අවස්ථාවක ඉන් ප්‍රයෝජන ගැනීම
iv එක් ව සිටි අයට නො කියා හොර රහසේ පලා යාම /
කිසිවකුට නො කියා පලා යාම
v. පරිහාණියට පත් වන කාලය / දියුණුව ඇන හිටින කාලය / පිරිහීමට පත්වන කාලය
vi. පක්ෂපාතී ව ක්‍රියා කිරීම / පල ප්‍රයෝජන බලාපොරොත්තුවෙන් ඒක පාර්ශ්වීය ව කටයුතු කිරීම

(ඉ) පහත දී ඇති එක් එක් යුගල පදය සෑදී ඇති රටාව කුමක් දැයි දක්වන්න.

(i) අත - පය (ii) දන්නා - හඳුනන
(iii) ජාති - ජන්ම (iv) සිරා - බිරා
(v) ලක - ලැස්ති (vi) යන - එන (ලකුණු 03 යි.)

**(ලකුණු ½ x 6 = 03 යි.)**

i. එකිනෙකට විරුද්ධ පද දෙකක් යෙදීම
ii. මුල් පදයේ අර්ථය දෙවන පදයෙන් තීව්‍ර කිරීම
iii මුල් පදයේ අර්ථය දෙවන පදයෙන් තීව්‍ර කිරීම / අර්ථයෙන් සමීප වන පද දෙකක් යෙදීම
vi. අර්ථ රහිත පද දෙකක් යෙදීම
v. මුල් පදයේ අර්ථය දෙවන පදයෙන් තීව්‍ර කිරීම / අර්ථයෙන් සමීප වන පද දෙකක් යෙදීම
vi. එකිනෙකට විරුද්ධ පද දෙකක් යෙදීම

**(ලකුණු ½ x 6 = 03 යි.)**

(ඊ) පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දක්වන්න.

(i) හොමරිකම (ii) නාම්බා
(iii) පෙළවහ (iv) ගස්ගෝනා
(v) ඇඹයො (vi) සිරිප්පානිය (ලකුණු 03 යි.)

i. කම්මැලිකම
ii. තරුණයා
iii. විවාහය
iv. වඳුරා
v. කොළ පාගන මිනිස්සු
vi. හිරිකිතය

**(ලකුණු ½ x 6 = 03 යි.)**

(උ) පහත දී ඇති ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත් ලියන්න.

(i) බෙත්ම (ii) ගොළුගල
(iii) මං පොල්ල (iv) ඉල්ලම් කූර
(v) පඬු පොවනවා (vi) කොට්ටෝරුවා (ලකුණු 03 යි.)

i. වැව් දියෙහි ප්‍රමාණයට කුඹුර බෙදා ගැනීම
ii. බබළන තත්ත්වයක නොමැති මැණික් ගල
iii. යාත්‍රාවේ මුහුදු මාර්ගය
iv. පොළොව යට ඉල්ලම් තිබේ දැ'යි සොයා බැලීමට භාවිත කරන කම්බි කූර
v. භික්ෂූන් වහන්සේගේ සිවුරු වර්ණ ගැන්වීම
vi. ආවතේවකරුවා (ශාන්තිකර්මවල දී)

**(ලකුණු ½ x 6 = 03 යි.)**

8. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අහෝමාප්‍රියප්‍රේමිලාමාපඤ්චකල්‍යාණියමාමනලෝලියඔබගේතුරුලහැරමරුගේතුරුලටයන්නටඇත්තේතවත් හෝරාකිහිපයක්පමණිමමඅවසන්වරටදඔබදැකගතයුත්තෙමිප්‍රේමියනිසැබවින්මඔබමටනෙතඳුනක්මයරසඳුනක්ම යසිතුමිණක්මයඅධරයුග්මයෙන්ඔබගේමුවමීපානයකෙසේවතුදුනේත්‍රයුග්මයෙන්ඔබරූමීපානයකරන්නෙමි අහෝප්‍රියදස්කොන්මමදඔබගේඅදර්ශනයෙන්චිත්තවෛකල්‍යයටපත්වසිටිමිමාගේයෞවනදේහයෙහිසෞකුමාර්ය යවින්දෝත්ඔබමයඅනංගයාගේමල්සරාගේශරප්‍රහාරයෙන්පහරකාසුරතකෙළියෙන්සන්තර්පණයවූවෝත්ඔබමයනාරි දේහනමැතිවිල්ජලයෙහිගිලීකාමදාහයනිවාලූවෝත්ඔබමයදන්නෝඋපාමිණිබැඳිදොරනාරිද්දයනුවෙන්මාඑදාකියූ දේඔබසැබෑනොකළෝදකළෝමයමාප්‍රියබඳඔබකියූවේසැබෑවක්මයපන්දහසකටමැදතිබුණත්උඩඑල්ලාරන්භාජන යනොවිදිදවිදිනාගුල්ලාරජුසිතුයේඔහුගේවසඟයෙහිසැමදාඔබසුරක්ෂිතයකියායඑහෙත්මාගේදැත්අතරතහාපපුතු රෙහිඔබසුරක්ෂිතවූබැව්කවුරුදනිත්දමාප්‍රේමියේමියෙනමොහොතෙහිදමාසිත්හිඔබමසිහිකරමිනෙත්හිඔබරුවම අඳිමිගත්හිඔබරසපහස්මසොයමිමෙසසරපුරාඔබරුවගුණමප්‍රාර්ථනාකරමි

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) 'විකල + ය = වෛකල්‍ය' නම් 'නිෂ්ක්‍රම + ය' යන්න කෙසේ සකස් විය යුතු ද?

(iii) ඝෝෂ මහාප්‍රාණ අක්ෂර සහිත පද දෙකක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(iv) 'අදර්ශන, ප්‍රාර්ථනා' යන වචන රේඵය සහිත ව නැවත ලියන්න.

(v) 'දැත්' යන්න සන්ධි වන අයුරු පියවරින් පියවර දක්වන්න.

(ලකුණු 15 යි.)

. "අහෝ! මා ප්‍රිය ප්‍රේමිලා, මා පඤ්චකල්‍යාණිය, මා මනලෝලිය, ඔබගේ තුරුල හැර මරුගේ තුරුලට යන්නට ඇත්තේ තවත් හෝරා කිහිපයක් පමණි. මම අවසන් වරට ද ඔබ දැක ගත යුත්තෙමි. ප්‍රේමියනි, සැබවින් ම ඔබ මට නෙතඳුනක් ම ය, (නෙතඳුනක් ම ය;) රසඳුනක් ම ය, (රසඳුනක් ම ය;) සිතුමිණක් ම ය. අධර යුග්මයෙන් ඔබගේ මුවමී පානය කෙසේවතුදු නේත්‍ර යුග්මයෙන් ඔබ රූමී පානය කරන්නෙමි." "අහෝ! ප්‍රිය දස්කොන්, මම ද ඔබගේ අදර්ශනයෙන් චිත්ත වෛකල්‍යයට පත් ව සිටිමි. මාගේ යෞවන දේහයෙහි සෞකුමාර්යය වින්දෝත් ඔබ ම ය. අනංගයාගේ – මල්සරාගේ – (මල්සරාගේ) ශර ප්‍රහාරයෙන් පහර කා සුරත කෙළියෙන් සන්තර්පණය වූවෝත් ඔබ ම ය. නාරිදේහ නමැති විල්ජලයෙහි ගිලී කාමදාහය නිවාලූවෝත් ඔබ ම ය.

"දන්නෝ උපා මිණි බැඳි දොර නාරිද්ද"

යනුවෙන් මා එදා කියූ දේ ඔබ සැබෑ නො කළෝ ද? කළෝ ම ය." "මා ප්‍රියබඳ, ඔබ කියූවේ සෑබෑවක් ම ය.

"පන්දහසකට මැද තිබුණත් උඩ එල්ලා
රන් භාජනය නොවිදි ද විදිනා ගුල්ලා"

"රජු සිතූයේ ඔහුගේ වසඟයෙහි සැමදා ඔබ සුරක්ෂිත ය කියා ය. එහෙත් මාගේ දෑත් අතරත හා පපුතුරෙහි ඔබ සුරක්ෂිත වූ බැව් කවුරු දනිත් ද? මා ප්‍රේමියේ, මියෙන මොහොතෙහි ද මා සිත්හි ඔබ ම සිහි කරමි, (කරමි;) නෙත්හි ඔබ රුව ම අඳිමි, (අඳිමි;) ගත්හි ඔබ රස රහස් ම සොයමි, (සොයමි;) මෙසසර පුරා ඔබ රුව ගුණ ම ප්‍රාර්ථනා කරමි."

**පද බෙදීමට ලකුණු 03 යි.**

**විරාම ලක්ෂණවලට ලකුණු 04 යි**

ii. නෛෂ්ක්‍රම්‍ය
iii. අධර, භාජනය
iv. අදර්‍ශන, ප්‍රාර්‍ථනා
v. දෙ + අත්
ද් + එ+ අත්
ද් + ඈ+ ත්
දෑත

**(ලකුණු 02 x 4 = 08 යි.)**